# ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමිය ශ්‍රී ලාංකේය සංවිධානයකි

## ප්‍රශ්න හා පිළිතුරු

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි

# ජමාඅතේ ඉස්ලාමිය ශ්‍රී ලාංකේය සංවිධානයකි

## ප්‍රශ්න හා පිළිතුරු

## ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි

**ප්‍රකාශනය ඃ**

ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි

77, ශ්‍රී වජිර ඥාන මාවත, කොළඹ - 09

දුරකථන ඃ 0112687091

ෆැක්ස් ඃ 0112686030

E-Mail secretariatsslji@gmail.com

# පෙරවදන

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් අනතුරුව මුස්ලිම් ප්‍රජාව පිළිබඳවත් විශේෂයෙන් මුස්ලිම් සමාජයේ යම් යම් පාර්ශව පිළිබඳවත් විවිධ සැක මතු කරන පරිසරයක් නිර්මාණය වී ඇති බව පෙනේ. මෙම නොවැළැක්විය හැකි මෙම තත්තවය සම්බන්ධයෙන් 'සත්‍යය ගවේෂණය' යන කෝණයෙන් ධනාත්මකව ක්‍රියා කිරීම ඉතා සුදුසු ක්‍රියාවක් යන්න අපගේ හැඟීමයි.

වැසුණු සැඟවුණු බොහෝ කරුණු පසෙක ලා, ඇසෙන දිසෙන කරුණු ගැන අනුමානයෙන් සැකෙන් බැලීමේ ප්‍රවනතාවයක් ඇති බව පිළිගත යුතුය. ආවරණය වී ඇති කරුණුවල ඇත්ත නැත්ත ඒ අයුරින්ම නිරාවරණය කරගැනීම බුද්ධිමත් ක්‍රියාවකි. ඇත්ත නැත්ත ඒ අයුරින්ම නිරාවරණය කරගැනීමට නම්, සියළු දෙනාම තමන් සතුව ඇති සත්‍ය තොරතුරු හෙළිදරව් කළ යුතුය.

මෙය මූලික කර ගනිමින් ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානය, අෑ සම්බන්ධයෙන් නගන ලද චෝදනා, විචිකිච්ඡා සැලකිල්ලට ගෙන එහි ඇත්ත නැත්ත ගැන ප්‍රත්‍යුත්තරයක්, ප්‍රශ්නෝත්තර මාලාවක් තුලින් ඉදිරිපත් කරයි.

ජමාඅතේ ඉස්ලාමි සංවිධානයේ ක්‍රියාකාරකම්, ප්‍රතිපත්තීන්, අරමුණු හා එහි ක්‍රියා පිළිවෙත් පිළිබඳ නිසි පැහැදීමක් ලබා දීමත්, සත්‍ය තොරතුරු පදනම් කර ගනිමින් අපගේ මෙම සංවිධානයට එරෙහිව ඉදිරිපත් කරන ලද අභූත චෝදනාවලට පැහැදිළි පිළිතුරක් ලබා දීමත් මෙම කුඩා පොත් පිංචය තුලින් අදහස් කෙරේ.

මින් පසුවත් මේ පිළිබඳව යම් කුකුසක්, සැකයක් පවතී නම්, සබඳතා තොරතුරු ලබා ගැනීමට පහත ලිපිනය හා ඔබට සම්බන්ධවිය හැකිය.

*ප්‍රධාන ලේකම්*
*ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි,*
*77, ශ්‍රී වජිරඥාන මාවත,*
*කොළඹ - 09*

## ප්‍රශ්න අංක - 1

4/21 ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳව ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානයේ ස්ථාවරය කුමක් ද?

*පිළිතුර* : එම ම්ලේච්ඡ ප්‍රහාරයේ කම්පනයෙන් තවමත් අප මිදී නැහැ. හේතුව මොන කෝණයෙන් බැලුවත් එහි දාමරිකත්වය තිබෙන්නේ ඉතා ඉහළ මට්ටමකයි. සියයට දෙසීයක්ම එය සැහැසියි, කුරිරුයි! එය සමස්ථ මිනිස් අගයන් විනාශ කළ කෲර සිද්ධියක්! ත්‍රස්තවාදින් තම නැණගුණ ශූන්‍ය කරමින් මහා විනාශයකට මුලපිරූ මෝඩ තකතීරුවන් වශයෙන්ද ඔවුන් නම් කළ හැකිය.

එම ප්‍රහාරය සිදුකළ හා සැලසුම් කළ කුමන්ත්‍රණකරුවන් මනුෂ්‍යින් යැයි කීමට තරම් නොසුදුසු දාමරිකයින්ය. කිසිදු වරදක් නොකළ අහිංසක ජනතාව, ආගමේ නාමයෙන් උන්මත්ත වී ඝාතනය කළ මැරයින්ට කෙසේ නම් මානවයින් යැයි පැවසිය හැකිද?

වියරුවෙන් මත් වී, ඔවුන් කළ මෙම ම්ලේච්ඡ ක්‍රියාවටත් සාමය අගයන ඉස්ලාමයටත් කිසිදු සම්බන්ධයක් නොමැති බවත්, මෙය ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ මානසිකත්වයට හෝ ආකල්පයට හෝ මුළුමනින්ම ප්‍රතිවිරෝධී ක්‍රියාවක් බවත් මෙහි සඳහන් කළ යුතුය.

මෙම නිසාවෙන් මුස්ලිම් ප්‍රජාව තමන්ට හැකි අන්දමින් එම ත්‍රස්තවාදීන් අත් අඩංගුවට ගැනීමෙහිලා රජයට තම සම්පූර්ණ සහයෝගය ක්‍රියාවෙන් ඔප්පු කළහ. මවක් තම කුසේ උපන් දියණිය පොලීසියට බාරදීමට තරම් උත්සුක වූවාය. මෙය මුස්ලිම් ප්‍රජාව තුල ඇති මානසිකත්වය හුවා දැක්වීමට දිය හැකි කදිම නිදසුනකි. මරාගෙන මැරෙන ත්‍රස්තවාදීන්ගේ මෘතදේහ භූමදානය කිරීමට මුස්ලිම් ප්‍රජාව ප්‍රතික්ෂේප කිරීම මෙයට තවත් නිදසුනකි.

අප්‍රේල් මස විසි එක් වනදා සිදුවූ මෙම ත්‍රස්ථවාදී ප්‍රහාරය නිසා ඇතිවූ තවත් පුදුමාකාර පුවතක් පිළිබඳවත් මෙහි සඳහන් කළ යුතුය. එනම් වගකිව යුතු බලධාරීන් මෙම ප්‍රහාරය ගැන කලින් දැන සිටී නමුත්, එම ත්‍රස්ත ප්‍රහාර හා එයින් ඇතිවන විනාශය වැළැක්වීමට එම බලධාරියෝ කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත්හ. සැකයට තුඩුදෙන මෙම ක්‍රියාව අපගේ සිත් තුළ රැව්දෙන තවත් කම්පා ගෙන දෙන පුවතකි.

## ප්‍රශ්න අංක - 2

ආගමේ නාමයෙන් කළ ප්‍රහාරයක් බව ඔබ සඳහන් කළා. මෙම ප්‍රහාරයට මුල් වූයේ ආගම තමයි යන අදහස පොදුවේ කියවෙනවා. ඒ පිළිබඳව ඔබගේ අදහස කුමක් ද?

*පිළිතුර* : අවුරුදු දහසකට වඩා මේ රටේ පවතින ආගමක් ගැනයි අපි මේ කථා කරන්නේ. ත්‍රස්තවාදී කඳවුරුවල රහසේ කනට කන කොඳුරමින් මතුවුණු ආගමක් ගැන නොවේ. වසර දහසකටත් වඩා ඉස්ලාමයේ කාරුණ්‍යය හා සානුකම්පිතය මේ රටේ වැජඹෙනු ඔබ දැක ඇති. නමුත් ත්‍රස්ත කඳවුරුවල බිහි කළ ඉස්ලාමයේ යම් වියරුවක්, උමතුවක් දකින්නට පුළුවන්.

ආගමක් අදහන සෑම ජන සමාජයක් තුලම ආගමේ නාමයෙන් මෙවැනි ත්‍රස්ථාවදීන් බිහිවෙන ප්‍රවනතා තිබෙනවා. එසේ බිහිවන ත්‍රස්ථ කල්ලි ඔවුන්ගේ ත්‍රස්ථ ක්‍රියාකාරකම් සඳහා ආගම මෙවලමක් ලෙස යොදා ගැනීමත් අප දැක තිබෙනවා. නමුත් එය අධ්‍යයනයකට ලක් කිරීමේදී, ඔවුන්ගේ ත්‍රස්ථ ක්‍රියාකාරකම් හා ඔවුන් අදහන ආගම අතර කිසිදු සබඳතාවක් නොමැති බව වටහා ගන්නට පුළුවන් වේවි.

## ප්‍රශ්න අංක - 3

මුස්ලිම්වරුන් අතර ආගමික භක්තිය වැඩිය. දේශානුරාගය අඩුයි යන මතයක් තිබෙනවා, ඒ ගැන මොනවද කියන්නේ?

*පිළිතුර* : වසර තිහක කාලයක් ලංකාවේ සිවිල් යුද්ධයක් තිබුණා. කාලයක් මව්බිමේ නිදහස වෙනුවෙන් අරගල තිබුනා. ඊටත් කලින් යටත් විජිත වකවානුව හෝ සිංහල රජවරුන්ගේ සමය වැනි සෑම කාලවකවානුවකදීම මේ රටේ මුස්ලිම්වරුන් සිංහල ප්‍රජාව සමග එක්ව තම මාතෘ භූමියේ සෛවරීභාවය වෙනුවෙන් ඉතා සමීපව කටයුතු කළා. අදටත් ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් විවිධ අංශවලින්

තම ජම්මභූමියට කල හැකි උපරිම දායකත්වය ලබා දෙමින් ජීවත්වෙනවා.

උතුරු නැගෙනහිර ජීවත්වන මුස්ලිම්වරුන් දමිළ ජනතාව සමග සමගියෙන් ජීවත්වෙනවා. පිට්ටුයි පොල්කුඩුයි වගේ යයි දමිළ ප්‍රජාවම වර්ණනා කරන තරමට සමීප සම්බන්ධතාවයක් ඔවුන් අතර තිබෙනවා.

ආගමික භක්තිය, ජාත්‍යාලය සහ මානව හිතවාදය එකිනෙකට බැඳී වෙන්කළ නොහැකි දේවල් බව අවධාරණයෙන් කිව යුතුයි.

රටේ උග්‍ර නියඟ තත්වයක් ඇතිවන අවස්ථවල දී, වැසි ලබාදෙන ලෙස මහමහිමාන්විත අල්ලාහ්ගෙන් නමස්කාර පූර්වකව ඇයද සිටීම  ඉස්ලාමීය සම්ප්‍රදායක්. මෙහිදී රටයි ආගමයි යන දෙක බෙදිය නොහැකි තත්වයක තිබීම දැකිය හැකියි. මව් රට ආක්‍රමණයකට ලක්වන අවස්ථාවක එම ආක්‍රමන බලවේගවලට එරෙහිව රටේ ජනතාව හා එක්ව සටන් කළ යුතු බවට ඉස්ලාමය අපට උපදෙස් දෙනවා. ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් දියත් කළ අරගලයේදී මහජාතිය සමග එක්ව උරෙනුර ගැටී සටන් කර, මුස්ලිම්වරුන් සනාථ කළේ එම ගුණයයි. මිනිසුන් සියලු දෙනාම එක මවකගේ දරුවන් බව ඉස්ලාමය අවධාරණය කරනවා. මෙයින් ඇඟවෙන්නේ මානව හිතවාදය හා ආගමික විශ්වාසය වෙන් කළ නොහැකි සංයුක්තයක් බවයි.

යථාර්ථය මෙසේ තිබියදී, මුස්ලිම්වරුන්ට ජාත්‍යාලයක් නොමැත? ඔවුන්ට ජාතික හැඟීමක් හෝ මනුෂ්‍යත්වයක්

හෝ නොමැත? යන මිත්‍යා මතයක් ඇති කිරීමට කිසියම් පිරිසක් උපක්‍රමශීලිව උත්සාහ දරන බවක් පේනවා.

අස්ථාවරවූ දේශපාලන තත්ත්වය, ආර්ථික අර්බුධ, දූෂිත පරිපානය, ඉහල යන අපරාධ රැල්ල, ව්‍යවස්ථා අර්බුද, මත්ද්‍රව්‍ය ජාවාරම ආදි වශයෙන් නිදහස ලැබූ කාලයේ පටන් විවිධ ගැටළුවලට මුහුණ පෑමට ශ්‍රී ලංකාවට සිදුව තිබෙනවා. අදටත් එය එසේම පවතින බව නොරහසක්. මැලේසියාව, සිංගප්පූරුව, ජපානය වැනි රටවල තත්ත්වයට දියුණු කිරීමට බෙහෝ ඉඩ ප්‍රස්ථා තිබියදීත්, දැන් තියෙන මෙම අරාජිත තත්වයට රට පත් කළේ මෙරටේ මුස්ලිම්වරුන් නොවෙයි. සමහර මුස්ලිම් දේශපාලකයින් මෙයට දායකවන්නට ඇති. සත්‍යය මෙසේ තිබියදීත්, වර්තමානයේ රටේම ඇති ප්‍රධාන ප්‍රශ්නය මුස්ලිම්වරුන් බව හංවඩු ගැසීම කෙතරම් අසාධාරණ ද?

ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් කිසි දිනක තම දේශය හෙලා දැක නැහැ. පාවා දී නැහැ. ශ්‍රී ලංකාවේ ඉපදුණු මුස්ලිම්වරුන් වන අපි, ශ්‍රී ලාංකිකයින් වීම ගැන ආඩම්බර වන බව කිසිඳු පැකිලීමකින් තොරව පවසන්නෙමු. අදටත් මුස්ලිම්වරුන්ගේ දෛනික ජීවිතයෙහි එය දැක ගත හැකියි. පොදු මුස්ලිම් ජනතාව තුල තම මාතෘභූමිය පිළිබඳ ඔවුන්ගේ සිතුවිලි මෙසේ පිළිබිඹු වෙනවා දැක ගත හැකියි.

රටවටා මුහුද... රට මැද කඳුකරය... එහි සිට හතර වටේ ගලාබස්නා ගංගා, පෙනෙන තෙක්මානයේම හරිත පරිසරය. සෞම්‍ය දේශගුණය, අධි රශ්නයක් හෝ අධි සීතලක් නැති සමබර කාලගුණය, වසර පුරා වැසි, සෘතුව

අනුව ඇඳුම් මාරු කිරීමට අවශ්‍ය නොවන තත්වයක්, ස්වභාවික සම්පත් වැනි අසීමිත සෞභාග්‍යයෙන් සපිරියි. එපමණක් නොව උගතුන්ගේ ආකල්පමය හා සිතුවිලි වල ශක්තියද ඉතා උසස් මට්ටමක පවතී.

ශ්‍රී ලංකාව දීර්ඝ ඉතිහාසයකටත් පෞරාණික උරුමයන්ටත් හිමිකම් කියන රටක්. තමන්ටම ආවේණික කමනීය දර්ශන හා සංස්කෘතික අංගවලින් සමන්විත දූපතක්. එපමණක් නොව දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායන්ට අනුගතවූ ජනතාවත්, බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම් යන ලෝකයේ ප්‍රධාන ආගම් හතර නියෝජය කරන සම්මිශ්‍රණයක්, ගෝලීය සිතියමේ අති වැදගත් කේන්ද්‍රස්ථානයක පිහිටීමක්. එපමණක් නොව කෘෂිකර්මාන්තය, බෝග වගාවන්, ගව පාලනය වගේම ධීවර කර්මාන්තය වැනි අනේක ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගෙන ආර්ථිකය වර්ධනය කිරීමේ අවස්ථා සහිත දේශයක්.

අපගේ උගතුන් වියතුන් නගන හඬ, මෙවන් වටාපිටාවක, පරිසර සංරක්ෂණය, සම්පත් උපයෝගිතාවය සැලකිල්ලට ගනිමින් රටට අවශ්‍යවන සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් සහගතව ඉදිරියට ගෙනයා හැකි නම්, මේ රට ආසියාවේ ආශ්චර්යය පමණක් නොව, ලෝකයටම ආශ්චර්යයක් වන්නට පුළුවන්.

උගත් නූගත් සියළු දෙනාම ආශ්චර්යය භූමියක් ලෙස ලංකාව ගැන සිතීම අප මව්බිමට හිමි තවත් විශේෂත්වයක්. කව්රුන් හෝ ශ්‍රී ලංකාව දෝෂදර්ශනයට ලක් කරන්නේද, එය ඔවුන්ගේ නොදැනුවත්කම. එසේත්

නොමැති නම් ඔවුන්ගේ අපේක්ෂා බංගත්වයක්. නැත්නම් පෞද්ගලික හෝ ආත්මාර්ථකාමී හේතුවක්. එවැනි අය සෑම ප්‍රජාවකම සිටිය හැකියි. ඒ හැර කිසියම් මුස්ලිම් පුරවැසියෙකු සැලසුම් සහගතව ශ්‍රී ලංකාව ප්‍රතික්ෂේප කරන, ශ්‍රී ලංකාවට එරෙහිව කටයුතු කරන තත්වයක් දැක ගත නොහැක. අදටත් සෙසු ප්‍රජාවන් සමග මිත්‍රත්වයෙන් හා සහයෝගයෙන් ජීවත්වන බව කව්රුත් දන්න හඳුනන සත්‍යයක්.

**ප්‍රශ්න අංක - 4**

ඔබේ තර්කය මුස්ලිම්වරුන්ගෙන් කිසි වරදක් සිදුවෙලා නැහැ? මේ රටට හෝ අනෙකුත් ප්‍රජාවන්ට ඔවුන්ගෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ? එහෙමද?

*පිළිතුර* : රටේ අනෙකුත් ප්‍රජාවන් මෙන් මුස්ලිම්වරුන් ද සාමාන්‍ය මිනිස්සු. මිනිසුන් තුල සාමාන්‍යයෙන් ඇති වැරදි ඔවුන් තුල නැහැ කියලා සුදු හුණු ගෑමට මම සූදානම් නැහැ. එහෙත් ඔවුන් රටේ ස්වෛරී භාවයට, ජාතික ආරක්ෂාවට හෝ ජාතික සංවර්ධනයට විරුද්ධව සැලසුම් සහගත ලෙස කඩාකප්පල්කාරී ක්‍රියාවල යෙදෙනවාද යැයි විමසුවහොත් එයට මාගේ පිළිතුර නැත යන්නයි.

මෙය හැර ජාතිවාදී හා ආගම්වාදී, දේශපාලනික හා පෞද්ගලික වශයෙන් වැරදි සිදුවෙමින් පවතින බව සැබෑය. එවැනි වැරදි මුස්ලිම් ප්‍රජාවේ පමණක් නොව රටේ සියළු ප්‍රජා අතර සිදුවෙමින් පවතී. ඒවා හැකි අයුරින් නීතිය මගින්, සාකච්ඡා මගින් නිරාකරණය කළ යුතුය. කිසියම් ප්‍රජාවක ඇති වැරදි, නිවැරදි කිරීමට

තවත් ප්‍රජාවක් පාරට බැස උද්ඝෝෂණය කරන්නේ නම් එය පිළිගත නොහැකි සම්ප්‍රදායක්. එසේ කිරීම සුදුසු ක්‍රියාමාර්ගයක් නම් රජයක් කුමකටද යන ප්‍රශ්නය මතුවනවා නේද? රජයේ කාර්යභාරය ජනතා ප්‍රශ්න ඔවුන්ටම භාර දී රට අස්ථාවරත්වයට පත් කිරීම නම්, ජනතාව විසින් රජයක් තෝරා පත් කරගන්නේ කුමක් සඳහාද?

## ප්‍රශ්න අංක - 5

කෙසේ වෙතත් අප්‍රේල් මස විසි එක් වනදා සිදුවූ ත්‍රස්ත ප්‍රහාරයෙන් පසු මුස්ලිම් ප්‍රජාව විවිධ අපහසුතාවලට මුහුණදීමට සිදුව ඇති බව සැබෑවකි. ඉන් එකක් නම් මුස්ලිම් සිවිල් සංවිධාන විශේෂයෙන් ඉස්ලාමීය සංවිධාන විවිධ විවේචනවලට ලක්වීම. එම සංවිධාන හා අන්තවාදය අතර සම්බන්ධයක් තිබේද යන්න පිළිබඳ නිරීක්ෂණයට ලක්ව ඇත. මෙම තත්වයේදී ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානය පිළිබඳ ඔබගේ ප්‍රතිචාරය කුමක් ද?

*පිළිතුර* : කෙටියෙන් මෙසේ පැවසිය හැකිය. ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානය යනු සංකල්පය, ව්‍යවහාරය යන දෙකේම ඉස්ලාමය ඉදිරිපත් කරන උදාරවූ ප්‍රතිපත්තීන් අනුගමනය කරමින්... පුද්ගලීය, පවුල්, සමාජීය, ස්වදේශීය කටයුතු වැනි සියල්ලෙහිම ආදර්ශවත් ශ්‍රී ලාංකිකයින් වශයෙන් ක්‍රියාකල යුතුය යන මතවාදය මුල්කර ගනිමින් ක්‍රියාත්මක වන සංවිධානයක්.

## ප්‍රශ්න අංක - 6

පොදු ජනතාව ආදර්ශවත් පිරිසක් ලෙස බිහිකිරීම වර්තමාන පරිසරයේ අසාමාන්‍ය කාර්‍යයක්, ඔබ එය කරන්නේ කෙසේද ?

*පිළිතුර* : සමාජයේ හා දේශයේ උන්නතිය වෙනුවෙන් වැඩ කිරීමට කැමැත්තක් දක්වන අය සමග පොදු එකඟතාවයකින් යුතුව වැඩකළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම. එම පොදු එකඟතාවය ශක්තිමත් කිරීම තුලින් ඔවුන්ව ආදර්ශවත් පුද්ගලයින් ලෙසට පරිවර්තනය කිරීම.

## ප්‍රශ්න අංක - 7

පොදු එකඟතා යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද?

*පිළිතුර* : එකට වැඩ කරන අය මෙහෙයවන “දාර්ශනික මගපෙන්වීම්” අප සංවිධානය සතුව පවතිනවා. ඒ ආශ්‍රිත එකඟතාවය පොදු එකඟතාවය ලෙස හඳුන්වන්නෙමු. එම මගපෙන්වීම් සංකල්ප සමග එකඟ නොවන අය අප හා එකතු වී වැඩ කිරීමට මැලි වෙනවා.

උදාහරණයක් ලෙස, ඉස්ලාමීය මූලධර්ම ඒ ආකාරයෙන්ම අනුගමනය කරමින්, අනෙකුත් ශාඛා හා අංශවලදී ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම. මෙම අංශවල විවිධ මත දැරීමේ නිදහස, අනුමැතිය ඉස්ලාමය අපට ලබා දී තිබෙනවා. මෙම ප්‍රතිපත්තිය පිළිගන්නා අය අතර මතභේද මතුවීම ද ඉතා අඩුයි. මෙම පිළිවෙත හේතුවෙන් මතභේද හෝ බෙදීම් ඇති වීමේ ඉඩකඩ අහුරා තිබෙනවා.

## ප්‍රශ්න අංක - 8

මෙය ඉස්ලාමය තුල ලබා දී ඇති අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ද?

*පිළිතුර* : ඉහත දැක්වූයේ ඉස්ලාමය තුල අදහස් ප්‍රකාශ කිරීමට

ලබා දී ඇති නිදහසේ මායිමයි. ඒවගේම දේශයේ තිබිය යුතු අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ගැනත් ඉස්ලාමය අපට මග පෙන්වනවා.

එනම්: 'බහුත්වය පිළිගැනීම හා ඇගැයීම'

ජාතීන් විවිධ ජනවර්ග ලෙස පැවතුන ද, අදහස් උදහස් චින්තනයක් ලෙස ඉදිරිපත් වුවද, මෙම විවිධත්වය සියලු අවස්ථාවල යතාර්ථයක් ලෙස දැකිය යුතුයි. එය ස්වභාවික දෙයකි. මෙම සත්‍යය පිළිගත් උදවිය තමන් ජීවත්වන දේශයේ මතභේදවලට හෝ බෙදීම් වලට හෝ හේතු කාරකයක් නොවනවා. මෙවැනි උදවිය ප්‍රකාශන හෝ වරණ නිදහස වර්ධනය කිරීමෙහි හා ඒවා ආරක්ෂා කිරීමෙහිලා උනන්දුවක් දක්වනු දැක ගත හැකියි.

## ප්‍රශ්න අංක - 9

බහුත්වය ස්වභාවික දෙයක් වුවත් වර්තමානයේ එය අර්බුධයක් කරගෙන තිබීම දක්නට තිබෙනවා. ජාතීන් අන් ජාතීන් දෙස බියෙන් බලන තත්වයක් බිහිවී තිබෙනවා. එක් එක් ආගමිකයින් සෙසු ආගමිකයින් අභියෝගයක් බව සිතනවා. ජමාතේ ඉස්ලාමී සංවිධානය මේ දෙස බලන්නේ කෙසේද?

*පිළිතුර* : බහුත්වය ස්වභාවික මෙන්ම මතභේදාත්මකයි යන්න සැබෑවකි. නමුත් එම ස්වභාවය ආරක්ෂා කරමින් මතභේද තුරන් කිරීමට සැවෝම උත්සාහ කල යුතු වෙනවා. එයට පිළිවෙතක් ද තිබෙනවා. එම පිළිවෙත අනුගමනය කිරීමෙන් මතභේද අවම කරගන්නට පුළුවන්. බහුත්වයේ ගැටළුවලට මුහුණ දීමේ දී උපකල්පනය,

කටකථා, සැකය, අවිශ්වාසය හෝ අනුමානවලට ඉඩ නොදිය යුතුයි. 'දැනුම හා අධ්‍යනය මුල්කර ගනිමින් සත්‍යය හෙළිදරව් කර ගැනීමේ ගවේෂණායකට ප්‍රමුඛත්වය දීම' යන මගපෙන්වීම අනුගමනය කළහොත් මතභේදයේ දොරටු වැසී අවබෝධයේ දොරටු විවර වනවා නොඅනුමානයි.

ජමාතේ ඉස්ලාමී සංවිධානය බහුත්වයේ ගැටළු දෙස බලන්නේ මේ ආකාරයටයි. එය මතභේදාත්මක කරුණක් කර ගැනීමේ අවශ්‍යතාවයක් ජමාතේ ඉස්ලාමී සංවිධානයට ඇති නොවන්නේ මේ නිසාය. එහෙත් අප රටේ වර්තමාන පරිසරයේ සැකය හා කටකථාවලට ප්‍රමුඛත්වයක් හිමිවී තිබෙනවා.

## ප්‍රශ්න අංක - 10

මේ මගපෙන්වීම් කවුරුන් හෝ අනුගමනය කරයි කියා ඔබ හිතනවාද?

*පිළිතුර* : ඇයි නැත්තේ, දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රටවල ඕනෑම ප්‍රශ්නයක් බලන්නේ දැනුම විමර්ශනය, සත්‍යය අනාවරණය වැනි පර්යේෂණාත්මක ගවේෂනයක් ඔස්සේ. ඔවුහු දියුණු සමාජයක් බවට පත්වීමට මෙයත් එක් හේතු කාරකයක්. අනුමාන, කටකථා, සැකය, බොරු ශෝභනවලට මුල් තැන දීම තුන්වෙනි ලෝකයේ රටවල්වල ප්‍රමුඛත්වයක් ගෙන ඇති තත්වයන්. ඔවුන්ගේ දියුණුව අඩාල වීමට එය ප්‍රධාන හේතුවක්. තුන්වෙනි ලෝක රටවල මාධ්‍යවල මෙහෙවරය වී ඇත්තේ බොරුව, සැකය, අනුමානය වැනි මනඃකල්පිත කරුණු සඳහා පෙනී සිටීම. එමගින්

තුන්වෙනි ලෝක ජනතාවගේ සිත් සතන් ඇදී යන දිසාව කොයිබටද යන්න මනාව පැහැදිලියි.

දැනුම, පර්යේෂණය, සත්‍යය අනාවරණය කරගැනීම වැනි ක්‍රියාකාරකම්වලට මුල්තැන ලබාදුන් සිද්ධියක් මෙහිදී පෙන්වාදීම ඉතා සුදුසු යැයි සිතනවා.

දේවදූත මුහම්මද්තුමාණන් ඉස්ලාමය දේශනා කල අවදියේ එතුමාගේ වදන් ශ්‍රවණේන්ද්‍රිය හරහා මුඛයටත්, මුඛය හරහා ශ්‍රවණේන්ද්‍රියටත් ගලායන තත්වයක් පැවතුනා. මෙම මුඛ පරම්පරා තත්වය දීර්ඝ කාලයක් පැවතුනහොත් දේවදූතයානන්ගේ වදන්වල ඇත්ත නැත්ත තෝරා බේරා ගැනීමට නොහැකි ව්‍යාකූල තත්වයක් අනාගතයේ ඇතිවිය හැකියි. මෙම තත්වය මගහරවා ගැනීමට පිළියමක් ලෙස මුල් කාල පරිච්ඡේදයේ විසූ ඉස්ලාමීය විද්වතුන් දේවදූතයානන්ගේ වදන්වල සත්‍යතාවය තහවුරු කරගැනීමට අපූරු ක්‍රමයක් භාවිතා කළා. පළමුව: තමන්ට ඇසීමට ලැබෙන දේවදූතයානන්ගේ යම් වදනක්, එම වදන වාර්ථා කරන මුල සිට අග දක්වා ඇති වාර්ථාකරුවන්ගේ ක්‍රමානුකූල ලැයිස්තුවක් ගොනු කිරීම. දෙවනුව: එම වාර්ථාකරුවන් සියල්ලගේ සෑම තෙරතුරක්ම එක්රැස් කිරීම. තෙවනුව: එම තොරතුරු දැඩි පරිශීලනයකට ලක් කිරීම. සිව්වැන්න: එම තොරතුරු පදනම් කරගනිමින් එම වදන පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට තීරණය කිරීම.

මෙම පදනම මත දේවදූතයානන්ගෙන් පටන් තමන් දක්වාවූ වාර්තාකරුවන්ගේ පෙලෙහි එක් එක් අයගේ විශ්වසනීය භාවය, මතක ශක්තිය, සත්‍යතාවය පමණක්

නොව එක් එක් අයට පෙර හා පසු විසූ අයව හමුවීමේ අවස්ථා තිබුණේද නැද්ද යන සියලු තොරතුරු පිළිබඳවත් දැඩි පරිශීලනයකට ලක් කළා. එමගින් දේවදූතයානන්ගේ සම්ප්‍රදායන් වාර්තාකරණයට සම්බන්ධ ලක්ෂ පහක තරම් පුද්ගලයින්ගේ ජීවිත කතාව සූක්ෂම ලෙස හදෑරූ ආශ්චර්යවත් ඉතිහාසයක සටහන් අදටත් ලිඛිතව සුරක්ෂිතව ඇති බව මෙහිදී සඳහන් කල යුතුයි.

දේවදූතයානන්ගේ සම්ප්‍රදායන්ගේ අව්‍යාජත්වය තහවුරු කර ගැනීමට දැනුම හා අධ්‍යනය තුලින් සත්‍යය අණාවරණය කිරීමේ ක්‍රියාවලියට ලබාදුන් වැදගත්කම මෙයින් පිළිබිඹු වෙනවා.

දේවදූතයානන්ගේ සම්ප්‍රදායන් හෙවත් හදීස් ක්ෂේත්‍රය හා සම්බන්ධව විවිධ මාදිලියේ විවිධ පර්යේෂණයන් වර්ධනය වීම හේතුවෙන්, කිසියම් පණිවුඩයක් ප්‍රවෘත්තියක් සාධක නොමැතිව විමර්ශනයක් නොමැතිව විශ්වාස කිරීමේ සම්ප්‍රදාය අහුරන ලැබුවා. මෙම ක්‍රමවේදය හඳුන්වාදීම තුලින් විද්‍යාවේ දියුණුව පමණක් නොව ජාතීන් අතර සංහිඳියාව ආරක්ෂාවීමටත් දායක වුනා. එම උදාර සම්ප්‍රදාය වර්තමානයේ බොහෝ අය පැහැර හැර තිබෙනවා. විශේෂයෙන් තුන්වෙනි ලෝකයේ රටවල නායකයින් හා මාර්ගෝපදේශකයින් එම ශාස්ත්‍රීය සම්ප්‍රදාය වලදමා ඇති බව කිව යුතුය.

## ප්‍රශ්න අංක - 11

මෙවැනි චින්තනයකින් යුක්තව ඔබ ශ්‍රී ලංකාව තුල කුමක් කරන්නට අදහස් කරන්නේද? ඔබේ සිහිනය සැබෑ වුවහොත් ශ්‍රී ලංකාව කුමන තත්තවයකට පත්වේවි ද?

පිළිතුර : ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යභාරයන් මෙසේය.

(1) ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානය ශ්‍රී ලංකාවට ආවේණික සංවිධානයක් වශයෙන් කටයුතු කිරීම යන්න අපගේ මූලික ප්‍රතිපත්තියයි. එහි සාමාජිකත්වය දැරිය හැක්කේ ශ්‍රී ලංකා පුරවැසියන්ට පමණයි. ජමාතේ ඉස්ලාමී යන නමින් හෝ වෙනත් නමකින් හෝ ලෝකයේ කිසියම් හෝ ප්‍රදේශයක ක්‍රියාත්මක වන කිසිම සංවිධානයක් සමග බැඳීමෙන් යුතු කිසිඳු නිල හෝ නිල නොවන සම්මුතියක් ජමාතේ ඉස්ලාමී සංවිධානයට නැහැ. ශ්‍රී ලංකාවේ නිති රීතිවලට එකඟව හා සාමකාමී ක්‍රියාමාර්ග ඔස්සේ ජමාතේ ඉස්ලාමී සංවිධානය තම ගැටළු නිරාකරණය කර ගැනීමට පෙළඹෙනවා. ශ්‍රී ලංකාවේ සාමයටත් එහි සංවර්ධනයටත් එරෙහිව ජමාතේ ඉස්ලාමී සංවිධානය කිසි විටෙකත් ක්‍රියා කරන්නේ නැහැ.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉහත මගපෙන්වීම් අනුව ජමාතේ ඉස්ලාමී සංවිධානය ඉකුත් අඩ සියවසයකට වැඩි කාලයක් කටයුතු කරමින් සිටිනවා. මෙම ප්‍රතිපත්ති මාලාව ජමාතේ ඉස්ලාමී සංවිධාන ව්‍යවස්ථාවෙහි අන්තර්ගතය.

එපමණක් නොව සෙසු ප්‍රජාවන් සමග එක්ව අපගේ දායකත්වය ලබා දී ශ්‍රී ලංකාවේ ඉටුකළ හැකි ව්‍යාපෘති මොනවාද යන්න පිළිබඳවත් හඳුනාගෙන තිබෙනවා.

ඒවා නම්,

1. ජාති ආගම් භේද නොතකා මානව සුබසෙත සඳහා වෙහෙසීම

2. ස්වභාවික සම්පත් ආරක්ෂා කර දියුණු කිරීම
3. යහ පාලන ඉලක්ක සමග කටයුතු කරන්නන්ට සහායවීම
4. සදාචාරවත් මාධ්‍ය සංස්කෘතිය දිරිගැන්වීම
5. "අපි ශ්‍රී ලාංකිකයෝ" යන මාතෘකාව යටතේ යහපත් සිවිල් සමාජයක් ගොඩනැගීම

මීට අමතරව ශ්‍රී ලංකාවේ ජීවත්වන මුස්ලිම් ප්‍රජාව, ශ්‍රී ලාංකික ප්‍රජාවක් වශයෙන් ජීවත්විය යුතුය. ශ්‍රී ලංකාවේ ජීවත්වෙමින් සවුදි හෝ ඊජිප්තු හෝ පාකිස්තානු සම්ප්‍රදායට සංසකෘතියට ඇබ්බැහිව ජීවත්වන ආකල්පයක් ඇති නොකර ගත යුතුය. යන්නෙහිද ජමාතේ ඉස්ලාමී සංවිධානය ඉතා අවධානයෙන්ය.

මෙලෙස මුස්ලිම් ප්‍රජාව මෙහෙයවන මාර්ගෝපදේශ විෂයෙහි පුළුල් වැඩ පිළිවෙලක් ක්‍රියාවට නංවා ඇත.

එය මෙසේ හැඳින්විය හැක,

1. බාහිර දෘෂ්ටියට හෝ සංකේතවලට හෝ දෙන වැදගත්කමට වඩා එය යහගුණවලට ලබාදීම.

2. මුස්ලිම් රටක ක්‍රියාත්මක කළ යුතු විද්වතුන්ගේ ආගමික තීන්දු තීරණ, සුළු ජාතීන් වශයෙන් ජීවත් වන අප රටෙහි ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රවනතාවය මගහැර සාරධර්ම ආරක්ෂා කිරීමටත්, සාමය සෞභාග්‍යය හා මානව සුභසාධනය යනාදිය ප්‍රගුණ කිරීමටත් ප්‍රමුඛත්වයක් ලබා දීම.

3. "දෙවියන් වහන්සේට ඉටු කලයුතු යුතුකම්වල අඩුපාඩු සිදු

වුවද, මිනිසුන් වෙනුවෙන් ඉටු කලයුතු යුතුකම් පැහැර හැරීමේදී ස්වර්ගය අහිමි විය හැකිය" යන ඉස්ලාමයේ ඉගැන්වීම් සැලකිල්ලට ගැනීම.

4. "අරමුණ පිවිතුරු චේතනාවකින් යුක්ත නම්, එය සාක්ෂාත් කර ගැනීමේ වැරදි ප්‍රවේශය ගැටළුවක් නොවේ" යන සංකල්පය ප්‍රතික්ෂේප කිරීම.

5. බේදය තුලින් වන දියුණුවට වඩා, එක්ව සංහිඳියාව වෙනුවෙන් අත්වන පරිහානිය අගයකොට සැලකීම.

6. සෑම අවස්ථාවන්වල දී නායකත්වයට ගරු කරමින් කටයුතු කිරීම, අවශ්‍ය වන අවස්ථාවලදී විධිමත් උපදෙස් ලබාදීම.

මෙවැනි සාරධර්මවලින් සමන්විත මුස්ලිම් ප්‍රජාවක් මෙරටේ බිහිවිය යුතුය යන්න ජමාතේ ඉස්ලාමී සංවිධානයේ අරමුණයි.

ඒ අනුව
(අ) රට පිළිබඳ දැක්ම
(ආ) රටේ ඇති කිරීමට අපේක්ෂා කරන මෙහෙවර
(ඇ) මෙරටේ මුස්ලිම් ප්‍රජාව ජීවත්විය යුතු ආකාරය පිළිබඳ අපේක්ෂාවන්

ඉහත සඳහන් සියල්ල ඉටුවූ අවස්ථාවක

- සම්පත්වලින් සපිරී
- ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ආරක්ෂා වූ

- සංවර්ධනය වූ
- රටක් වශයෙන්

අපේ මාතෘ භූමිය ඉතා සුන්දර දේශයක් වනු ඇත. මෙවන් රටකට පක්ෂව තම දායකත්වය සපයන ආදර්ශවත් ප්‍රජාවක් වශයෙන් මුස්ලිම් ප්‍රජාවද වැජඹෙනු ඇත.

අපගේ සිහිනය සැබෑ වූ දවසක ශ්‍රී ලංකාව කෙබඳු රටක් බවට පත්වන්නේ ද? යන ඔබගේ පැණයට පිළිතුර මෙයයි.

## ප්‍රශ්න අංක - 12

ශ්‍රී ලංකාවේ ඉස්ලාමීය පාලනයන් ඇතිවිය යුතු යැයි ඔබට ආශාවක් නැත්ද?

පිළිතුර : ශ්‍රී ලංකාවේ අපගේ අපේක්ෂාවන් මොනවාද යන්න පිළිබඳව අප පැහැදිලි කළෙමු. එම අපේක්ෂාවන්ද සිහිනයකි. ඉස්ලාමීය පාලනය සම්බන්ධයෙන් කීමට ඇත්තේ එවැනි දේකට අපි සැලසුම් කිරීමට හෝ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට හෝ ආරාධනා කිරීමට හෝ ජමාතේ ඉස්ලාමී සංවිධානය කිසිවිටකවත් තීරණයකට නොව සාකච්ඡාවකට හෝ භාජනය කර නොමැත යන්නයි.

## ප්‍රශ්න අංක - 13

එසේ නම්, ජමාතේ ඉස්ලාමි සංවිධානය විවේචනය කරන බොහෝ දෙනෙක් පාලනය හා දේශපාලනය සමග ඔබගේ සංවිධානය සම්බන්ධ කරන්නට හේතුව කුමක්ද?

පිළිතුර : එය ඒ අයගෙන්ම විමසිය යුතු ප්‍රශ්ණයක්. එහෙත් අපගේ නිගමනය අනුව ඔවුන් එසේ විවේචනය කිරීමට හේතු දෙකක් තිබිය හැකියි.

1. ජමාතේ ඉස්ලාමී සංවිධානය සුප්‍රසිද්ධ නමකි. එම ප්‍රසිද්ධිය තුල දේශපාලනයත් අන්තර්ගතය. විශේෂයෙන් පාකිස්තානයේ ජමාතේ ඉස්ලාමි සංවිධානය, බංගලාදේශයේ ජමාතේ ඉස්ලාමි සංවිධානය යන දෙකම ඒ ඒ රටවල දේශපාලන පක්ෂ වශයෙන් කටයුතු කරයි. ඉන්දීය ජමාතේ ඉස්ලාමි සංවිධානය වෙනත් නමකින් නොබෝදා දේශපාලන පක්ෂයන් ආරම්භ කර ඇත. එහෙත් ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානය පක්ෂ දේශපාලනයෙන් තොරව ක්‍රියා කළ යුතුය යනුවෙන් ආරම්භයේ සිටම තම ව්‍යවස්ථාවේ වගන්තියක් ඇතුලත් කර තිබෙනවා. ඒ බව නොදත් බොහෝ විචාරකයින් ජමාතේ ඉස්ලාමී සංවිධානය පාලනය අත්පත් කර ගැනීමට උත්සහ කරන සංවිධානයක් බව පදනම් විරහිත ප්‍රකාශයක්, චෝදනාවක් ඉදිරිපත් කරනවා. ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානය පාකිස්තාන, ඉන්දීය හෝ බංගලාදේශ ජමාතේ ඉස්ලාමී සංවිධානවල පිටපතක් නොවේ. ඔවුන් සමග නිල හෝ නිල නොවන කිසිඳු සම්මුතියක් ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානයට නොමැත යන්න ඔවුන් නොදැන සිටීම මෙයට මූලික හේතුවක් විය හැකියි?

2. ඉස්ලාමීය රාජ්‍ය පාලනය සමග ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානය සම්බන්ධ කර කථා කිරීමට තව හේතුවකුත්ද සඳහන් කළ හැකිය. මුස්ලිම් ලෝකය හා සම්බන්ධ දේශපාලන විවේචන හා විශ්ලේෂණ ඉදිරිපත් කරන අප

සංවිධානයේ නිල සඟරාවක් වන 'අල්-හසනාත්' මාසිකය දෙවන හේතුව ලෙස සැලකිය හැකිය.

ලෝකයේ මුස්ලිම් රටවල දේශපාලනය ගැනත්, එහි පැවත්වෙන දේශපාලන අර්බුද, උද්ඝෝෂණවල හොඳ නරක වගේම එහි ධනාත්මක හා සෘණාත්මක පිළිබඳ සංවාදාත්මක ලිපි සෑම අල්-හසනාත් කලාපයකම වාගේ පළ වෙනවා. ශ්‍රී ලංකාවේ දේශපාලනය පිළිබඳවත් කාලීන ලිපි එහි ප්‍රකාශනය වෙනවා. මෙවැනි දේශපාලන විග්‍රහ නිතර කියවන පාඨකයින් අප දේශපාලනය පිළිබඳ රුචියක් දක්වන බව යම් නිගමනයකට එලඹීට හේතුවක් වන්නට ඇති.

## ප්‍රශ්න අංක - 14

ඇත්තටම ඔබලා දේශපාලන ගැන රුචියක් දක්වන්නේ නැත්ද?

*පිළිතුර* : අප අතර බහුතරයක් දේශපාලනය කුණු ගොඩක් ලෙස දකිනවා. ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානය සදාචාර දේශපාලනයක් සඳහා නොහොත් ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායන් ආරක්ෂා කිරීමට උත්සුක වන උදවියට සහාය දැක්වීමට කැමති සංවිධානයක්. නමුත් අප සංවිධානගේ ස්ථාවරය පක්ෂ දේශපාලනයෙන් තොරව මෙම සහයෝගය ලබා දීමයි.

## ප්‍රශ්න අංක - 15

දේශපාලන ගැන උනන්දුවක් දක්වන අයව දේශපාලනයේ නිරතවීමෙන් වළක්වන ක්‍රියාවක ඔබ නිරතවන බව චෝදනා කිරීමට ඉඩ තිබෙනවා නේද?

*පිළිතුර* : ජමාතේ ඉස්ලාමී සංවිධානය දේශපාලන පක්ෂයක් වශයෙන් ලියාපදිංචි කර මැතිවරණයකට ඉදිරිපත් වන්නේ නැහැ යන්න අපගේ ස්ථාවරයයි. එහෙත් අප සංවිධානයේ සාමාජිකයෙක් මෙරටේ පුරවැසියෙකු වශයෙන් දේශපාලනයේ නිරතවීම වැලැක්වීම අපගේ අරමුණ නොවේ. අප සංවිධානයේ සාමාජිකයෙකු පක්ෂ දේශපාලනයේ නිරතවීමට කැමති නම් තම සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වී තමාට කැමති පක්ෂයක හෝ ස්වාධීනව හෝ තම දේශපාලන ගමන ආරම්භ කළ හැකිය. එය පුරවැසි අයිතිවාසිකමකි. එයට බාධා කිරීමට අපි කිසිසෙත්ම ඉදිරිපත් වන්නේ නැහැ.

## ප්‍රශ්න අංක - 16

යහපාලනය සඳහා වූ ජාතික පෙරමුණ හා ජමාතේ ඉස්ලාමී සංවිධානය අතර ඇති සම්බන්ධය කුමක්ද? එම පක්ෂයේ නිර්මාතෘ ඔබ නොවේද?

*පිළිතුර* : (PMGG) යන නමින් මඩකලපුව ආශ්‍රිතව දේශපාලන කණ්ඩායමක් ක්‍රියාත්මක වෙමින් තිබුණා. ජමාතේ ඉස්ලාමි සංවිධානයේ සාමාජිකයින් පිරිසක් එම කණ්ඩායම සමග එකතුවී දේශපාලන කටයුතුවල නිරතවීමට කැමැත්ත ප්‍රකාශ කර තිබුණා. එසේ කරන්නේ නම් අප සංවිධානයේ ස්ථාවරය අනුව ජමාතේ ඉස්ලාමී සංවිධානයෙන් ඉල්ලා අස්වී එසේ කරන මෙන් අපි ඔවුනට අවධාරණය කර සිටියා. ඔවුහු එය පිළිගෙන අප සංවිධානයෙන් ඉල්ලා අස්වී NFGG දේශපාලන සංවිධානය හා එක් වුනා. NFGG කියන්නේ ජමාතේ ඉස්ලාමී සංවිධානයවත් ජමාතේ ඉස්ලාමී කියන්නේ හතඩධ සංවිධානයවත් නොවේ.

## ප්‍රශ්න අංක - 17

NFGG සමග ජමාතේ ඉස්ලාමි සංවිධානයට රහස් සම්බන්ධයක් තිබෙන බව කියවෙනවා.

*පිළිතුර* : JVP, UPM එක්කත් තවත් පක්ෂ සමගත් අපට සම්බන්ධතා තිබෙනවා. හතඨඨ එක්කත් ඒ වගේ තමයි.

රටේ සුභසාධනයට මුල්තැන දී කටයුතු කරන අය සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගෙන යෑම එලදායි නොවේ ද? ඔවුන්ට හැකි පමණින් සහාය නොදෙන්නේ නම් අප ප්‍රකාශ කරන දේශ ප්‍රේමයේට කුමක් වේද? ඒකෙන් අදහස් වෙන්නේ නැහැ අපි ඔවුන්ගේ අය වෙනවා කියලා හෝ ඔවුන් අපේ සංවිධානයේ කියලා.

## ප්‍රශ්න අංක - 18

(SLMC) ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය නිර්මාණය කලෙත් ජමාතේ ඉස්ලාමි සංවිධානය තමයි කියා මෑතකදී අයෙක් ප්‍රකාශ කළා නේද?

*පිළිතුර* : ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය හෝ ජමාතේ ඉස්ලාමි සංවිධානය කියන්නේ රහස්‍ය සංවිධාන නොවෙයි, ඒක එහෙමයි කියලා සාක්ෂි තිබේ නම් ඔප්පු කරන්න සාධක ඉදිරිපත් කළ යුතුයි නේද?. මුස්ලිම් කොංග්‍රස් නායක අෂ්රෆ් මහතාගේ බිරිඳ ෆේරියල් අෂ්රෆ් මහත්මිය හා එහි දෙවෙනි නායක අමාත්‍ය රවූෆ් හකීම් වගේ පක්ෂයේ ආරම්භක නායකයින් සිය ගණනින් තවමත් ජීවතුන් අතර සිටිනවා. මෙහි සත්‍ය අසත්‍යතාවය ගැන ඔවුන්ගෙන් විමසා තහවුරු කරගන්න පුළුවන් නේද?

## ප්‍රශ්න අංක - 19

දේශපාලන සම්බන්ධයකුත් නහැ. ශ්‍රී ලංකාවට ආවේණික සංවිධානයක් කියලත් කියනවා. එසේ නම් ජමාතේ ඉස්ලාමී සංවිධානය යන නම යොදා ගැනීමට හේතුව කුමක්ද?

*පිළිතුර* : 1954 වර්ෂයේ මෙම සංවිධානය ස්ථාපිත කළ අය තැබූ නමක්. එය ස්ථාපිත කළ කවුරුත් දැනට ජීවතුන් අතර නැහැ. ඔවුන් විසින් එසේ නම් කරන ලදී, එයිට වඩා යමක් කියන්නට අපට පුළුවන් කමක් නැහැ.

## ප්‍රශ්න අංක - 20

ඔවුන් තැබූ නම ඔබ වෙනස් කළ හැකිව තිබුනා නොවේද?

*පිළිතුර* : නම වෙනස් කිරීම වරදක් නැහැ. මෙම නමින්ම ක්‍රියාත්මක වෙන්න ඕනැකමක් තිබේද යන සාකච්ඡාව විටින් විට අප අතර ඉස්මතු වෙනවා. එහි යම් එකඟතාවක් තිබුනත් නම වෙනස් කිරීමේ කාර්යයට අප යොමු වුනේ නැහැ. නම වෙනස් කිරීම අපේ සාමාජිකයින් අනුමත කළත් සමාජයේ විවේචනවලට පිළිතුරු දීමේ අවශ්‍යතාවයක් පැන නගින නිසාවෙන් අප එයින් වැලකී සිටියා.

## ප්‍රශ්න අංක - 21

4/21 ත්‍රස්තවාදි ප්‍රහාරයෙන් අනතුරුව ත්‍රස්තවාදයේ අලගිය මුලගිය තැන් සොයා බැලීම් ගැඹුරින් කෙරීගෙන යනවා. ඇතැමුන් ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානය සම්බන්ධ කරමින් කථා කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ ගැන ඔබේ අදහස කුමක් ද?

*පිළිතුර* : ජමාතේ ඉස්ලාමී සංවිධානය ඉකුත් වසර 60 කට වැඩි කාලයක් ස්ථිර ලිපිනයක් සහිතව මේ රටේ ක්‍රියාත්මක වන නීත්‍යානුකූල සංවිධානයක්. සැඟවිලා රහසි ගතව වැඩ කරන සංවිධානයක් වශයෙන් කවදත් තිබිලා නැහැ. ත්‍රස්තවාදය, අන්තවාදය කියන ඒවායේ ස්වභාවයෙන් ජමාතේ ඉස්ලාමී සංවිධානය හාත්පසින්ම වෙනස්. ප්‍රසිද්ධියේ වැඩ කරන සංවිධානයකට එවැනි න්‍යාය පත්‍රයක් තියෙන්න පුළුවන් කමක් නැහැ.

උදාහරණයට: විරුද්ධ වීම, හුදකලා වීම, වෙන්වී යාම, රහස්‍ය ආරක්ෂා කිරීම, රහසි ගත සංවිධානයේ සාමාජිකයින් තම දෙමාපියන්, අඹු දරුවන්ටත් වඩා තම කණ්ඩායම් සමග සෙනෙහසක් පවත්වාගෙන යාම, කණ්ඩායමෙන් පිටස්තර අන් අදහස්වලට ගරු නොකිරීම, තම ඥාතීන් හා මිතුරන් තුල තමන් යහපත් පුද්ගලයින්ය යන හැඟීම් ඇතිවෙන ආකාරයේ උපක්‍රම භාවිතා කිරීම, ඒ සඳහා මුසාවාදය අනුමත දෙයක් කරගැනීම, හේතුවක් නොමැතිව පිරිස් සමග එදිරිවාදිකම් පැවත්වීම, හිතාමතාම ඔවුන් හෙලා දැකීමේ ප්‍රකාශ නිකුත් කිරීම, තමන් හිතන නීතිය ක්‍රියාත්මක කිරීමේදී පරිසරය, මිනිසුන් හා යතාර්ථයන් අමතක කරන තරමට තීව්‍රතාවයෙන් කටයුතු කිරීම, සිනහව විනෝදය ආදියට සමුදීම, විකාර රූපික වීම, සැම දෙනා දෙසම සැකයෙන් බැලීම වැනි අන්තවාදයේ හා ත්‍රස්තවාදයේ සියළු ලක්ෂණ ඉස්ලාමයට පටහැනිය. මේවා ඉස්ලාමයෙන් තහනම් කරන ලද ගුණාංග. ඉස්ලාමයට පටහැනි එවැනි කිසිම ලක්ෂණයක් ජමාතේ ඉස්ලාමී සංවිධානයේ සාමාජිකයින් තුල වර්ධනය වීමට ඉඩකඩ අහුරා තිබෙනවා. හේතුව අප මුලින් සඳහන් කළ ප්‍රතිපත්තීන් පිළිගෙන ඒ අනුව

ක්‍රියා කිරීමේ එකඟතාවයෙනුයි ඔවුන් අප සංවිධානයේ සාමාජිකත්වය ලබා ගන්නේ. අපගේ මාර්ගෝපදේශ සංකල්ප අන්තවාදයේ හා ත්‍රස්තවාදයයේ ලක්ෂණවලට මුළුමනින්ම ප්‍රතිවිරුද්ධ ඒවා.

එම නිසා ජමාතේ ඉස්ලාමි වැනි සංවිධානයකින් අන්තවාදය බිහිවීමේ හැකියාවක්, ප්‍රවනතාවයක් කිසිසේත්ම නැහැ. එසේ වර්ධනය වූ ඇති බව කව්රුන් හෝ චෝදනා කරන්නේ නම්, ජමාතේ ඉස්ලාමී සංවිධානයේ ප්‍රතිපත්තීන් වලට විරුද්ධ වී අන්තවාදී ලක්ෂණවලට ගොදුරු වීම හේතුවෙන් අප සංවිධානයෙන් නෙරපූ අය හෝ ඉවත් වී ගිය අය අලලා කරන චෝදනාවක් විය හැකියි. එසේත් නොමැති නම් සමහර විට ජමාතේ ඉස්ලාමී සංවිධානය පිළිබඳ නිසි අවබෝධයක් නොමැතිව එවැනි චෝදනා නගන්නට ඉඩ තිබෙනවා. එවැනි අයට අල්ලාහ් දෙවිඳුන් නිසි අවබෝධයක් ලබාදිය යුතු යැයි අපි ප්‍රර්ථනා කරනවා.

## ප්‍රශ්න අංක - 22

අන් අයට විරුද්ධවීම, ඉවත්වීම, හුදකලා වීම යනාදී අන්තවාදී ලක්ෂණ ගැන ඔබ සඳහන් කලා. ඔබ කව්රුන් සමග හෝ විරුද්ධ වී නැත් ද? ඉවත්ව ගොස් නැත් ද? සම්ප්‍රදායි මුස්ලිම්වරුන් පිළිබඳ ඔබේ අදහස කුමක් ද?

*පිළිතුර* : මෙම පැණයට පිළිතුරු දීමට යෙදුම් දෙකක් අවශ්‍යයි.

1. වෙනස්වීම
2. විරුද්ධවීම

ජමාතේ ඉස්ලාමී සංවිධානය වෙනස්වීම යථාර්ථයක් ලෙස පිළිගන්නවා. විරුද්ධවීම, කලහ ඇති කිරීම ශාපයක් ලෙස දකිනවා. වෙනස් අදහසක් දැරීම යනු පුද්ගලයෙකුගේ හෝ සංවිධානයකගේ හෝ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රශ්නයක්. එරෙහිවීම යනු පුද්ගලයාගේ හෝ සංවිධානයේ නිදහස උල්ලංඝනය කිරීමක්.

මේ අනුව ජමාතේ ඉස්ලාමී සංවිධානය වෙනස් මතයක් දැරීම හෙවත් වෙනස්වීම ඈට හිමි අයිතිවාසිකමක් ලෙස සලකයි. එහෙයින් වෙනස් මතවලට ගරු කරන අතර, එයට එරෙහිවීම හෝ බෙදීම් ඇති කිරීම වැලක්වීමට උපරිම උත්සාහයක් දරනවා. අපගේ ලිපි ලේඛන හා දේශන සමග සමීපව සිටින අයට මේ ගැන හොඳ අවබෝධයක් ඇතැයි අපි විශ්වාස කරනවා.

මෙම සීමාව ඉක්මවා ලියන හා කියන අයව ජමාතේ ඉස්ලාමී සංවිධානය ප්‍රතික්ෂේප කරනවා. ඔවුන්ගේ මෙම ක්‍රියාව නිවැරදි කිරීමට උත්සහ දරනවා. එවැනි අයට අප සංවිධානයේ වේදිකා තහනම් කිරීමටද ඇතැම් විට කටයුතු කර තිබෙනවා. ඒ සියල්ල අභිබවා යන විට අප සංවිධානය ඔහුන් හා ඇති සම්බන්ධතාව විසංධි කර ගන්නවා.

අප සංවිධානය සමාජයෙන් වෙන්වී හුදකලා වීමේ ප්‍රවනතාවයකින් යුක්තද? යන ප්‍රශ්නය ගත්විට එසේ වෙන්වී හුදකලා වීම එක්තරා රෝගයක් ලෙස අපි දකිනවා.

ජමාතේ ඉස්ලාමී සංවිධානය හා එහි චින්තනය අවබෝධ

කරගත් අය සමාජයෙන් ඈත් වන්නේ නැහැ. සමජයෙන් ඈත් වන අයවත් තුරුළු කර ගැනීමට උත්සහ කරනවා. මෙම ක්‍රියාවලිය තුලින් මයජනතාව සමග මිශ්‍රවී කටයුතු කිරීමේ ප්‍රවනතාවය වර්ධනය වෙනවා. එහි අර්ථය මහජනතාව අප සංවිධානය ගැන ඇති අනවබෝධය, බිය, සැකය දුරු වීමට ඉවහල් වෙනවා යන්නයි. අන්තවාදී ලක්ෂණ අප තුල තිබුණොත්, කිසි දිනක එවැනි බන්ධනයක් උදා වන්නේ නැහැ.

සමාජ මෙහෙවරෙහි හා දේශය ගොඩනැගීමේ මෙහෙවරෙහි මුස්ලිම් සමාජය හා මුස්ලිම් නොවන සමාජය යන භේදයකින් තොරව සැමදෙනා එක්ව කටයුතු කිරීම ජමාතේ ඉස්ලාමී සංවිධානයේ බලා පොරොත්තුවයි. මෙය සනිටුවන් කර ගැනීමට අපට දීර්ඝ ගමනක් යා යුතුව තිබෙන බව අප පිළිගන්නවා.

සම්ප්‍රදායී මුස්ලිම්වරුන් පිළිබඳ පැවසීමට ඇත්තේ, සම්ප්‍රදායි මුස්ලිම්වරුන් මොවුන්ය, සෙසු අය ඔවුන්ගෙන් වෙනස්ය යන බෙදීම් අප තුල නැත. එයට හාත්පසින්ම වෙනස්, ඉතා වැදගත් අදහසක් සමාජ ගත කිරීමට උත්සහ දරන්නෙමු. එය තමා, උපන් පලියට මුස්ලිම්වරයෙකු ලෙස ජීවත් නොවන්න. ජීවත්වන රට ලෝකය ධර්මය යන සියල්ල අවබෝධ කරගෙන ජීවත් වෙන්න. එවිට ඔබටත් ඔබගේ දේශයටත් යහපතක් වනු ඇත. තවද මරණින් මතු ජීවිතයේදී ද ඔබ ජයග්‍රහණය කරනු ඇත.

අපගේ යුතුකම මෙම අදහස සමාජ ගත කිරීමයි. එය පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සැමට හිමිය. ප්‍රතික්ෂේප කරන අය අපගේ හතුරන් ලෙස සලකන්නේ

නැහැ. එනම් විවිධත්වය එරෙහිවීමක් කර ගැනීමට අප අකමැතියි.

ඒ අතර සම්ප්‍රදායි මුස්ලිම් යනුවෙන් අපෙන් කොටසක් බෙදා වෙන් කර දකින්නට වෙර දරන අයගෙන් ප්‍රශ්නයක් ඇසීමට තිබෙනවා. 1915වේ දී මුස්ලිම්වරුන්ට එරෙහිව ජාතිවාදී කෝලාහලයක් හටගත් බව ඔබට මතක ඇති. එම අවස්ථාවෙහි රටේ සියයට සියයක්ම සිටියේ සම්ප්‍රදායි මුස්ලිම්වරුන්. පහර කෑමට ලක් වූ එකල විසූ එම සම්ප්‍රදායි මුස්ලිම්වරුන් යහපත් අය ලෙස නොසැලකුවේ ඇයි? අද එම උදවිය සිල්වත් අය වුනේ කෙසේද?

## ප්‍රශ්න අංක - 23

එය නම් විමසා බැලිය යුතු කරුණක් ? ඇත්තටම ඔබට විරුද්ධවාදීන් යනුවෙන් කවුරුත් නැත්ද? ඔබට එරෙහිවන බොහෝ දෙනෙක් සිටිනවා නොවේද?

*පිළිතුර* : මහපොලොවෙහි ජීවත් වන සියළු දෙනාම අප මෙන් සිටිය යුතු යැයි අපේක්ෂා කරන අයට ලෝකයේ විරුද්ධවාදීන් වැඩියෙන් සිටිය හැකියි. අපව කවුරුන් හෝ විරුද්ධවාදීන් කරගන්නේ නම් අපට කළ හැක්කේ කුමක්ද? සෑම ප්‍රජාවකටම තමන්ටම ආවේනික වූ අනන්‍යතාවයක් ඇත. එම අනන්‍යතාවයන් ඔවුන්ගේ ය, මෙම අනන්‍යතතාවයන් අපේය යන ස්ථාවරයක සිට ජීවත්වීමට හැකිනම් විරුද්ධවාදීන් අවම කරගත හැකිය. අවබෝධය වර්ධනය කිරීම හා අනවබෝධය සමනය කිරීම යන්න එකක් නොව දෙකකි. මෙම සත්‍යය තේරුම් ගෙන ක්‍රියා කළහොත් විරුද්ධවාදීන් බිහිවීම බෙහෙවින් අඩු කර ගත හැකිය.

ඔව්, අපටත් විරුද්ධවාදීන් සිටින බව සැබෑය. ඔවුන් වෙන කවුරුවත් නොව, අධිරාජ්‍යවාදීන්ය. ඔවුන්ගේ ඕනෑ එපාකම් වෙනුවෙන් රටවල් හා ජාතීන් ඉත්තන් ලෙස භාවිතා කෙරෙන වග අපගේ බහුතරයකට දැනුමක් නොමැත. ජාතීන් අතර ඉත්තන් හසුරුවන අය! කාඩිනල් රංජිත් මැල්කම් පියතුමා පුන පුනා කියා සිටින්නේ, 4/21 ප්‍රහාරයේ තිරය පිටුපස සිටින එම ඉත්තන් ලොවට අනාවරණය කරන ලෙසය.

සතුරන් පිළිබඳ කාඩිනල් රංජිත් මැල්කම් පියතුමාගේ මෙම දැක්ම හා අපත් එකඟ වන්නෙමු.

## ප්‍රශ්න අංක - 24

ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට එරෙහිව ක්‍රියාකරන ජාතිවාදී සංවිධාන ගැන ඔබගේ අදහස කුමක්ද? ඔවුන් විරුද්ධවාදීන් නොවෙයිද?

*පිළිතුර :* ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක රවුෆ් හකීම් මහතා මෙවැනිම ප්‍රශ්නයකට පිළිතුරු දීමේදී පහත ආකාරයට සඳහන් කර තිබුණා. "දේශපාලනය කරන්න හතුරෙක් ඕනෑ. හතුරෙක් නොමැතිව දේශපාලනය කිරීම දුෂ්කර කාර්යයක්" යැයි කීමට කරම් තත්වය වෙනස්වී තිබෙනවා. මෙම තත්තවය යටතේ වර්තමාන දේශපාලන පිටිය මුස්ලිම් ප්‍රජාව හතුරෙකු කර ගෙන. මීට පෙර දෙමළ ප්‍රජාව එම භූමිකාවට ගොදුරක් වුනා. දැන් එම ස්ථානයට මුස්ලිම්වරුන්ව ගොදුරක් කර ගෙන. මීට වඩා වෙනත් උත්තරයක් දීමට දෙයක් අප සතුව නැහැ.

## ප්‍රශ්න අංක - 25

හතුරන් නොමැති ලෝකයක සටනක් කුමකට ද? එම නිසා සාමකාමීව සිටිමු යැයි සිතනවාද? ජිහාද් පිළිබඳ ඔබගේ අදහස කුමක් ද?

*පිළිතුර* : මුස්ලිම්වරුන්ගෙන් සුළු පිරිසකුත් මුස්ලිම් නොවන්නන්ගෙන් බහුතරයකුත් ජිහාදය පිළිබඳ වරදවා වටහාගෙන කුලප්පුවී ඇති බව කිව යුතුයි. කෙටියෙන් මෙසේ පැවැසිය හැකියි. ජිහාද් යනුවෙන් අදහස් කෙරෙන්නේ, "රජයක් තම රටේ ආරක්ෂාව වෙනුවෙන් කරන හමුදාමය මෙහෙයුමක්." එය උතුම් කුර්ආනයේ සඳහන් පදයක් හෙයින්, අපි උතුම් කුර්ආනය ක්‍රියාවට නංවනවා යැයි පවසමින් සිතූ මතයට කරන්න පුළුවන් කාර්යයක් නොවේයි. මෙම සත්‍යය ගැන මුස්ලිම්වරුන්ගෙන් බොහොමයකට නිසි වැටහීමක් තිබෙනවා. ශ්‍රී ලංකාවේ වෙසෙන මුස්ලිම් ප්‍රජාව ලංකාවේ ජිහාදයක් ක්‍රියාත්මක කළ යුතුය යැයි කථා නොකරන්නේ මෙම අවබෝධය හේතුවෙනි. මුස්ලිම්වරු උතුම් කුර්ආනය දිනපතා පාරායනා කරනවා. ඇතැමුන් වනපොත් කරනවා. එහෙත් මුස්ලිම්වරුන්ට වඩා අද ජිහාදය ගැන කථා කරන්නේ මුස්ලිම් නොවන අයයි. මෙසේ පවසන අය 4.21 ප්‍රහාරය එල්ල කලේ කව්රුන් දැයි අපෙන් ප්‍රශ්ණ කළ හැකියි. එවැනි ප්‍රහාරයක් එල්ලවෙන බව දැන දැනත් එය සිදුවීමට ඉඩ හැරියේ කව්රුන් ද? එම ප්‍රහාරයට බිලි නොවී රටත් ජනතාවත් ආරක්ෂා කිරීමට ජිහාදයක් ප්‍රකාශ කරන්නට තිබුණේ එම බලධාරීන් විසින් නොවේද? ඒ ගැන නිසි දැනුමක් ඇත්තේ ඔවුන්ටය. එහෙයින් එම බලධාරීන්ගෙන්ම මේ බව විමසා බැලිය යුතුය.

## ප්‍රශ්න අංක - 26

ඔබ ආගම හදාරන්නේ කුමන මූලාශ්‍රයෙන්ද? ඔබගේ සංවිධානයේ මාර්ගෝපදේශකයින් වශයෙන් සැලකෙන විද්වතුන් කවුරුන්ද? මව්ලානා මව්දූදි, යූසුෆ් අල් කර්ලාවි වැන්නන් පිළිබඳ ඔබේ අදහස කුමක්ද? ඔබ අනුගමනය කරන ඇතැම් විද්වතුන් අන්තවාදය පතුරුවන අය යැයි වර්තමානයේ චෝදනා කරනවා නේද?

*පිළිතුර* : විද්වතුන් හා ඔවුන්ගේ අදහස් පිළිපැදීම සම්බන්ධයෙන් අපගේ ස්ථාවරය පැහැදිලි කිරීම සුදුසු යයි මා සිතනවා.

අල්ලාහ් දෙවිඳුන් හා දේවදූතයින් හැරුණු කොට, වෙන ඕනෑම විද්වතෙක් සියයට සියයක් නිවැරැදි යැයි අපි පිළිගන්නේ නැහැ. එදා සිට අද දක්වා මුස්ලිම් ප්‍රජාවගේ දැඩි විශ්වාසය සියයට සියයක්ම නිවැරදි පුද්ගලයින් වන්නේ දේවදූතයින් පමණක් යන්නයි.

ඉස්ලාමීය විද්වතෙක් කිසියම් කාලයක් සඳහා ඉදිරිපත් කළ විග්‍රහයක් වෙනත් කාලපරිච්ඡේදයකට හෝ පරිසරයකට එම විග්‍රහය නුසුදුසු විය හැකියි. නැතහොත් අවශ්‍ය තරම් උතුම් කුර්ආනයේ හෝ දේවදූත මුහම්මද්තුමාගේ පිළිවෙත්, සාධක ලෙස ඉදිරිපත් කිරීමට ඔහු අපොහසන්වන්නට පිළිවන්. එවැනි විවිධ හේතූන් නිසා විද්වතුන්ගේ මත සියයට සියයක්ම වැරදි බව නොසලකුවත්, සියයට සියයක්ම නිවරැදි බවත් පිළිග ැනෙන්නේ නැහැ.

තවද සමාජයේ බිහිවූ සියලු ඉස්ලාමීය විද්වතුන් බුද්ධිමය දේපල වශයෙන් සැලකෙනවා. විද්වතුන් පිළිබඳ මෙම

දෘෂ්ඨිකෝණ දෙකම ජමාතේ ඉස්ලාමී සංවිධනය පිළිගෙන තිබෙනවා. එම හේතුවෙන් අපගේ සංවිධනය ඉස්ලාමීය විද්වතුන් සම්බන්ධයෙන් පහත ස්ථාවරයන් අනුගමනය කරනවා.

1. සියලු විද්වතුන් මුස්ලිම් සමාජයට හිමි බුද්ධිමය දේපලකි. එම නිසා කිසිම විද්වතෙකුට දොස් පැවරීම හෝ අවමන් කිරීම වැරදි පිළිවෙතකි.

2. සියලු විද්වතුන්ගේ නිර්මාණ, ඉදිරිපත් කිරීම් අධ්‍යනයකට ලක් වන සුළුය. ඔවුන්ගේ නිර්මාණ හැදෑරීම තුලින් දැනුම අවබෝධය පර්යේෂණ හැකියාව වර්ධනය වන්නේය. එසේ හදාරන්නනන්ද කිසියම් කාලපරිච්ඡේදයක බුද්ධිමය දේපල බවට පත්විය හැක.

3. එහෙත් හැදෑරීම හා ක්‍රියාත්මක කිරීම එකක් නොව දෙකකි. හදාරන සියළු දෑ ක්‍රියාත්මක කළ නොහැකිය. එසේ ඉගෙන ගන්නා සියල්ල ක්‍රියාත්මක කිරීමට පටන් ගතහොත් සමාජය එයින් පිරිහීමට පත්වෙනවා මිස දියුණුවට පත්වන්නේ නැත. මෙනයින් අප ජීවත්වන පරිසරය, කාලය, ගැටළු යනාදිය සැලකිල්ලට ගෙන ක්‍රියාවට නැංවිය හැකි අදහස් මොනවාද යන්න තීරණය කල යුතුය. කාලයටත් පරිසරයටත් නොගැලපෙන අදහස් ක්‍රියාත්මක කළ නොහැක.

4. දැනුම පමණක් මුල් කර ගනිමින් සාකච්ඡාවකින් තොරව එය ක්‍රියාත්මක කිරීම අප සංවිධානයේ පිළිවෙතක් නොවේ. මෙම විනයට පටහැනිව කෙනෙකු ක්‍රියා කළහොත් අප සංවිධානය ඔහුව නිවැරදි කිරීමට උත්සහ දරයි. එය අසාර්ථක වීමේදී ඔහුව නෙරපා දැමීමට කටයුතු කරයි.

5. ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානය ඉහත සඳහන් ආකාරයට විද්වතුන්ගේ විෂයෙහි කටයුතු කරයි. එය මව්ලානා මව්දූදිතුමා විය හැකිය. යූසුෆ් අල් කර්ලාවිතුමා විය හැකිය. වෙනත් විද්වතෙකු විය හැකිය. ඔවුන්ගේ අදහස් එලෙසම පිටපත් කිරීමේ තත්වයක් අප සංවිධානය තුල නොමැත.

6. ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානයේ සාමාජිකයෝ මව්ලානා මව්දූදිතුමාගේ කෘතීන් මෙන්ම යූසුෆ් අල් කර්ලාවිතුමාගේ පොත්ද කියවති. ඒ වගේ සූෆි විද්වතෙකුවන ඉමාම් ගස්සාලිතුමා, සලෆි විද්වතෙකු වන ඉබ්නු තය්මියාතුමා, තබ්ලීක් ජමාත් සංවිධානයේ විද්වතෙකු වන මව්ලානා අබුල් හසන් අලිතුමා යනාදී විශාරදයින්ගේ කෘතීන්ද කියවති. ඔවුන් කී සියල්ල දෑස් පියා ගෙන අනුගමන කරන තත්වයක් ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානය තුල දක්නට නැහැ.

7. ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානයේ අය මව්ලානා මව්දූදිතුමාගේ අදහස් වලට විරුද්ධවන අවස්ථා බොහොමයක් ඇති බව බොහෝ අය අවබෝධ නොකරන්නේ අප සංවිධානයේ ඉහත ස්ථාවරය ඔවුන් නොදන්නා හෙයිනි. මව්ලානා මව්දූදිතුමාගේ මතය කාන්තාවන් මුහුණ ආවරණව කළ යුතුය යන්නයි. ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානයේ ස්ථාවරය කාන්තාවන් මුහුණ ආවරණය කිරීම අත්‍යාවශ්‍ය නොවන බවයි. මව්ලානා මව්දූදිතුමා තම සංවිධානය පාකිස්ථානයෙන් දේශපාලන පක්ෂයක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට උනන්දු කළේය. ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානය දේශපාලනයේ නිරතවීම කිසිවිටකත් අනුමත නොකළේය. මෙවැනි උදාහරණ තවත් දක්වන්නට පුළුවන්.

ඕනෑම විද්වතෙකුගෙන් අපට ඔබින දේ කුමක්ද නුසුදුසු දේ කුමක්ද යන්න තීරණය කෙරෙන්නේ සාකච්ඡා වට කිහිපයකින් පසුවයි.

## ප්‍රශ්න අංක - 27

ඔබ එසේ පැවසුවද, ඉගෙන ගැනීමට ලබාදී ඇති නිදහස හේතුවෙන් ඇතැමුන් නොමගට යොමු විය හැකි නේද? ඔවුන් එම තත්වයට පත්වීමට දායක වන්නේත්, පසුව ඔවුන් ඔබේ සංවිධානයෙන් නෙරපා දැමීමක් වන්නේත් ඔබ දුන් නිදහස නිසා නොවේද?

*පිළිතුර* : විහිදුණු සුවිශාල ලෝකයේ අධ්‍යනය කිරීමේ නිදහස ලබා දෙන්නේ අපිද? අප්‍රේල් 21දා සිදුවූ මරාගෙන මැරෙන ප්‍රහාරයට සම්බන්ධ ත්‍රස්ථවාදීන් හා ජමාතේ ඉස්ලාමි සංවිධානය අතර කිසිඳු සම්බන්ධකමක් තිබුණේ නැහැ. ඔවුන්ට අයි.එස්.අයි.එස් ඉගැන්වීම් හැදෑරීමේ අවස්ථාව ලබාදුන්නේ කවුරුන්ද?

කඩයකින් පිහියක් මිළදී ගත් අයෙකු එම පිහියෙන් තවත් අයෙකු මරා දමයි. දැන් කඩේ අයිතිකරුට ඇඟිල්ල දිගු කර ඔබ නිදහයේ පිහිය විකුණා ඇති නිසයි ඔහු ඝාතකයා වුනේ යැයි කඩකාරයාට චෝදනා නැගිය හැකිද? ඝාතකයෙකු වීමට හේතුව පිහිය නොවෙයි. පිහිය නිදහසේ විකිණීමට තබා ඇති නිසාත් නොවෙයි.

අන්තවාදියෙකු වීමට බලපාන වෙනත් හේතු කාරක බොහෝමයක් ඇත. නියමිත පුද්ගලයාගේ ස්වභාවයේ අන්තවාදී ප්‍රවනතා තිබීම හෝ දැඩි මත දැරීමේ ස්වභාවය, අන්තවාදයට පෙළඹවීමේ අසාමාන්‍ය පරිසරය, මර්ධනය,

අන්තවාදී ගින්නට මුදල්, ආයුධ නැමැති ඉන්දන යොදවා ඇවිලීමට සලස්වන බලවේග, ඒ මදිවට ඉස්ලාමයට වැරදි අර්ථකථන සපයා කැලෑ නිතිය ක්‍රියාත්මක කරන අයි. එස්. අයි. එස් වැනි රහස් සංවිධාන ප්‍රහාරයක් දියත් කිරීමේ සැලසුමක් ඇති බවට තොරතුරු ලද පසුත්, ඒවා වැලක්වීමට කටයුතු නොකර, එය නරඹමින් සිටී වගකිව යුත්තන් වැනි පැහැදිලි හේතු රාශියක් තිබියදීත්, පිහිය විකිණීම වැරදි බව කීම පුදුමයක් නොවේද? ඉහත ප්‍රශ්නයට මෙම කෝණයෙන් බලන විට එහි සැබෑ පසුබිම වටහා ගන්නට පුළුවන් නේද.

පිහියක් නිදහසේ විකිනීමට එරෙහිව ක්‍රියා කිරීමෙන් ඉහත අපරාධයට යම් බලපෑමක් කල හැකිය. ඕනෑ නම් එය 0.5% හෝ එයට අඩු ප්‍රතිශතයක් විය හැකිය. එය 100% ක් හේතු කාරකයක් ලෙස මවා පෙන්වීමට තැත් කිරීම කෙතරම් සාධාරණ ද?

## ප්‍රශ්න අංක - 28

ඔබේ සංවිධානයෙන් ඉවත් කරන ලද අය හෝ අන්තවාදයට සම්බන්ධ අය පිළිබඳ ඔබගේ අදහස කුමක් ද?

*පිළිතුර* : මා මුලදී සඳහන් කළ ආකාරයට, සමාජය හා දේශය ගොඩනැගීමේ මෙහෙවරවලදී අප සමග එක්වන්නන් පොදු එකඟතාවයකට පැමිණිය යුතුය. එම එකඟතාවය සිදුවන්නේ ප්‍රතිපත්තීන් මතයි. එම එකඟතාවය බිඳ දමන අයෙකු අප සමග සිටිය නොහැක. ඔහු ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානයෙන් ඉවත් කෙරෙනු ඇත. ඒ අනුව බුදුපිළිමවලට හානි පැමිණ වූ සිද්ධියට සම්බන්ධ අයෙකු

එම සිදුවීමට මාස කිහිපයකට පෙර ජමාතේ ඉස්ලාමි සංවිධානයේ සාමාජිකත්වයෙන් නෙරපන ලදි. එයට වසර තුනහමාරකට පෙර ඉහත කී හේතු මුල් කර ගෙන ජමාතේ ඉස්ලාමි සංවිධානයට අනුබද්ධ සංවිධානයක් වන ශ්‍රී ලංකා ඉස්ලාමීය ශිෂ්‍ය ව්‍යාපාරයේ තවත් අයෙකු ඉවත් කරන ලදී. එසේ ඉවත් කල අයට සහාය පලකල තවත් කිහිපදෙනෙකුද පසුව එම ශිෂ්‍ය ව්‍යාපාරයෙන් නෙරපන ලදී.

## ප්‍රශ්න අංක - 29

ඔවුන් පිටව ගියේ කුමන මතභේදයක් නිසාද? ජමාතේ ඉස්ලාමි සංවිධානයෙන් හා ශිෂ්‍ය ව්‍යාපාරයෙන් ඔවුන් ඉවත් කිරීමට හේතුව ඔවුහු අන්තවාදීන් වුනු නිසාද?

*පිළිතුර* : අප සංවිධානයෙන් නෙරපන විට ඔවුන් බරපතල අන්තවාදී ක්‍රියාවලට යොමුවී තිබුණේ නැහැ. එයට වෙනස්ව අන්තවාදී අදහස් ඔවුන්ගේ කතාවල දක්නට තිබුණා. ජමාතේ ඉස්ලාමි සංවිධානයේ ඇතැම් ස්ථාවරවලටද ඔවුන් විරුද්ධ වුනා.

නිදසුනක් වශයෙන් සහජීවනය ආරක්ෂා කළ යුතුය යන ස්ථාවරයට ඔවුන් විරුද්ධ වුනා. රට පෙරදැරි කරගෙන ජමාතේ ඉස්ලාමි සංවිධානය ක්‍රියාත්මක කළ ඇතැම් ව්‍යාපෘතින් පුරාජේරු බව ඔවුන් විවේචනය කළා. මෙවැනි සිතුවිලි ඔස්සේ ශිෂ්‍යයන් තුල තමන්ට අවනත කණ්ඩායමක් හදා ගැනීමට ශිෂ්‍ය සංවිධානයේ ප්‍රධානියෙක් උත්සහ කළා. තවද අප සංවිධානයේ සාමාජිකයෙක් අපගේ ව්‍යවස්ථාව පිළිගන්න බැරි බව කියා සිටියා. මෙම තත්වය මත ඔවුන් නෙරපනු ලැබුවා.

## ප්‍රශ්න අංක - 30

අන්තවාදී චින්තනයෙන් ඔවුන් මුදවා ගැනීමට ඔබ කටයුතු කළේ නැත්ද?

*පිළිතුර* : පෞද්ගලික මට්ටමෙන් හා සාමූහිකව, මූලස්ථානයේ අය විවිධ අය විවිධ ආකාරයෙන් ඒ පිරිස හමුවී හරිමගට ගෙන ඒමේ උත්සහයක යෙදුනා. එම සියලු ප්‍රයන්ත නිශ්ඵල වූ බව කිව යුතුයි.

## ප්‍රශ්න අංක - 31

ඔවුන් පිළිබඳව පොලිසියට හෝ අදාල අංශවලට ගොස් මේ බව පැමිණිලි කළාද?

*පිළිතුර* : මොවුන්ගේ අන්තවාදය එක්තරා ද්වේශ කථාවක ස්වරූපයෙන් තමයි තීව්‍ර වුනේ. ජමාතේ ඉස්ලාමි සංවිධානයේ ක්‍රියාකලාපයට එය නොගැලපෙන එකක් වුනා. එවැනි සංස්කෘතීන්, අන්තවාදී අදහස් අපගේ සංවිධානයේ, ශ්‍රී ලංකා ඉස්ලාමීය ශිෂ්‍ය ව්‍යාපාරයේ වර්ධනය නොවිය යුතුය යන අදහසින් ඔවුන්ව නෙරපීමට කටයුතු කළා. රටේ එවකට ද්වේශ සහගත, දනවන වෛරී කථා සංස්කෘතියක් ගොඩනැගෙමින් තිබුණා. මොවුන්ට මෙවැනි අන්තවාදී අදහස් පහළ වුනේ ඒවායින්ද කියා අප දන්නේ නෑ. මොවුන්ටත් වඩා මහා පරිමානයෙන් වෛරී කථා සංස්කෘතියක් රටේ පවතින තත්වයකදීත් එයට විරුද්ධව රජය කිසිඳු පියවරක් ගෙන තිබුණේ නැහැ. පොලිසියෙන් හෝ බුද්ධි අංශයෙන් එවැනි අය අත්

අඩංගුවට ගත් බවට සාධක තිබුනෙත් නැහැ. ජාතිවාදී වෛරී කථාවලට විරුද්ධව අත් අඩංගුවට ගැනීම් හෝ පරීක්ෂණ කරන බවක් අපට පෙනුනේ නැහැ. එම තත්වය උඩ පැමිණිලි කළ යුත්තේ කාටද කියන ප්‍රශ්නෙකුත් අපට තිබුණා.

එහෙත් ඉස්ලාමීය ශිෂ්‍ය ව්‍යාපාරය තම සමාජිකයින් පිරිසක් නොරපා ඇති බව සෙසු සාමාජිකයින්ට දැනුම් දීමට කටයුතු කළා. ඒ මාර්ගයෙන් බුද්ධි අංශ පවා ඒ පිළිබඳව දැනුවත් වෙන්නට ඇති. ඉන්පසුව සිදුවූ සිදුවීම් මාලාව පිළිබඳව අපට වඩා ඔවුන් දැනුවත්ව සිටියා.

## ප්‍රශ්න අංක - 32

ඔබගේ ප්‍රතිපත්තීන් මුල් කර ගනිමින් අන් අය මෙහෙයවන්නේ ඇයි දැයි කෙනෙක් ප්‍රශ්න කරන්නට පුළුවන්? එක් එක් අය තම තමන්ගේ කැමත්ත අනුව ජීවත්වුන දෙන්. ඇයි ඔබ කරදර වෙන්නේ?

*පිළිතුර* : මෙය සාමුහිකව කටයුතු කරන සියලු දෙනාගෙන්ම ඇසිය යුතු ප්‍රශ්නයක්?

- මිනිසා සාමුහික ජීවියෙක්

- සාමුහික ප්‍රයන්තයක් ලෙස කටයුතු කිරීම ඔවුන්ට හිමි අයිතියක් වගේම අවශ්‍යතාවයක්.

- ප්‍රජාතාන්ත්‍රවාදී රටක සුවිශේෂී ලක්ෂණයක් වශයෙනුත් මෙය හැඳින්විය හැකියි.

- රටවල ප්‍රජාවල උන්නතියට සාමුහික ප්‍රයන්තය ලොකු දායකත්වයක් ලබා දෙනවා.

මෙසේ විවිධ දෘෂ්ඨී කෝණයන් ඔස්සේ ලෝකයේ සමාජයේ උන්නතිය වෙනුවෙන් උනන්දු කරවන ක්‍රියා පිළිවෙතක් ලෙස මෙම සාමුහිකත්ව ප්‍රයන්තය සඳහන් කල හැකියි.

සාමුහික ප්‍රයත්නයක් අවශය නැත. එයින් කිසිඳු ඵලක් නැත යන තීරණයකට එළඹීමේ තත්වයක් බිහි වන්නේ, එය මෙහෙයවන්නේ කව්රුන්ද? මෙහයවන විධිය? ඒවා මෙහයවන සංකල්ප? එහි ප්‍රතිඵල වැඩදායීද? වැනි ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමෙන් අනතුරුව බව මතක් කළ යුතුය.

- එපමණක් නොව, සාමුහික ප්‍රයත්නයක ප්‍රතිඵලය සැමවිටම සියයට සියයක්ම නිවැරදි විය යුතුය යන්න වැදගත් වන්නේ නැහැ. පන්තියක ශිෂ්‍යයින්ගෙන් කිහිප දෙනෙකු අසමත් විය හැකිය. රෝහලක ප්‍රතිකාර ලබන්නන්ගෙන් සතිපතා හෝ මාස්පතා එක්කෙනෙක් දෙන්නෙක් මරණයට පත්විය හැකිය. මෙවැනි ප්‍රථිඵල හේතුවෙන් පාසල හෝ රෝහල වසා දමන්නේද නැත.

- අඩ සියවසකට අධික කාලයක් දියත් කළ සාමුහික ප්‍රයත්නයෙන් රටටත් සමාජයටත් හිතකර පුරවැසියන් දහස් ගණනනක් බිහිවුනා. එයින් එක්කෙනෙක් දෙන්නෙක් නොමගට යොමු වීම බැලිය යුත්තේ ඉහත සඳහන් ආකාරයටයි.

- ඔබ ඇයි කරදර වෙන්නේ යනුවෙන් ඇසීම ප්‍රශ්නයක් ලෙස පිළිගන්න අමාරුයි.

## ප්‍රශ්න අංක - 34

සාම පරවියෙකු ලෙස ඔබලා පෙනී සිටියත්, ඔබලා හරි කපටි බව කෙනෙකු පවසනු අසන්නට ලැබුනා. මේ ප්‍රශ්නයට ඔබ කොහොමද පිළිතුර දෙන්නේ?

*පිළිතුර :* කපටි නරියෙකුට සාම පරවියෙක්ගේ භූමිකාව රඟපාන්න පුළුවන් වෙන්නේ කෙටි කාලයකටයි. ඉකුත් වසර 65ක් තිස්සේ අපි මේ රටේ ක්‍රියාත්මකයි. හෙළිදරව් වූ කපටිකම් තිබුණා නම්, ඕනෑම කෙනෙකුට ඒවා හෙළිදරව් කරන්නට අවස්ථාවක් තිබුණා. අප සංවිධානයේ බොහෝ අය වයසට ගිහින්. ඉතිරි කාලයේ හෝ ඔවුන් කපටිකමින් යම් ප්‍රයොය්ජනයක් ලබා ගත හැකි නේද? නැතහොත් තවදුරටත් කපටි භූමිකාව රඟපාමින් සිටිමේ ඵලය කුමක්ද? මෙතෙක් රඟපෑමෙන් අත්පත් කරගත් සෞභාග ්‍යයයන් කවරේද? එසේ යමක් ඇත්නම් අදටත් එය ප්‍රසිද්ධ කල හැකි නේද?

## ප්‍රශ්න අංක - 35

ඔබ පිටියේ දියත් කර ඇති කාර්‍යයන් මොනවාද? මොනවගේ ප්‍රතිඵල ඔබ මෙතෙක් අත්පත් කරගෙන තිබෙනවාද?

*පිළිතුර :* ඔබේ සිහිනය සාර්ථක වුවහොත් ශ්‍රී ලංකාව කොයිබටද? යනුවෙන් ප්‍රශ්නයක් අසා තිබුණා. එම පැණයට අදාල පිළිතුරක් මීට පෙර ලබා දුන්නා. අපගේ සිහිනය, ඉලක්කය හෙවත් සාධනය පිළිබඳවත් මා විස්තරාත්මක පැහැදිලි කිරීමක් කලා යයි සිතනවා. ඒ සඳහා ක්‍රියාත්මක කෙරෙන වැඩ පිළිවෙල මෙසේ පෙළ ගැසිය හැකිය.

(1) දැනුම ප්‍රසාරණය කිරීම
ඉස්ලාමය සම්බන්ධ දැනුම, වර්තමාන ලෝකය පිළිබඳ දැනුම යන භේදයකින් තොරව දැනුම වර්ධනය කරීමේ මගපෙන්වීම් ලබාදී හැකි තරම් දැනුවත් කිරීමේ කාර්ය භාරයක නියලීම.

(2) සමාජ ප්‍රතිසංස්කරණය
ශ්‍රී ලංකාවේ පරිසරය පසුබිමක් කර ගනිමින්, පුද්ගල, පවුල්, ප්‍රජා, වෙළඳාම, දිවිය වගේම අනෙකුත් විවිධ ක්ෂේත්‍රවල ඉස්ලාමීය ඉගැන්වීම් ක්‍රියාත්මක කළ හැකි ආකාරය පිළිබඳ මගපෙන්වීම් ලබාදීම.

(3) සමාජ උන්නතිය
සමාජයේ පහල ස්තරයේ ගැටළු නිරාකරණය කිරීම සඳහා සුභසාධන හා ඵලදායී ව්‍යාපෘතිවල නිරත වීම.

(4) රට ගොඩනැගීම
රට වැසියන් සමග එක්වී දේශයේ යහපත් අනාගතය, සුභසිද්ධිය උදෙසා ක්‍රියා කිරීම. මේ යටතේ පස්වැදෑරුම් වැඩ සටහනක් හඳුන්වා දී ඇත. ජමාතේ ඉස්ලාමි සංවිධානය සෙසු ප්‍රජාවන් සමග එකතුව මෙම වැඩ සටහන ක්‍රියාවට නැංවීම.

අ. මානව සුභසාධනය ඉහල නැංවීම.
ආ. ස්වාභාවික සම්පත් ආරක්ෂා කර වැඩිදියුණු කිරීම.
ඉ. යහ පාලනයක් සඳහා ඉදිරිපත් වන්නන් සමග සහයෝග යෙන් කටයුතු කිරීම.
ඊ. "අපි ශ්‍රී ලාංකිකයෝ" යන තේමාව යටතේ යහපත් සිවිල් සමාජයක් ගොඩනැගීමට උපකාරී වීම.

උ. සදාචාරවත් මාධ්‍ය සංස්කෘතියක් වර්ධනය කිරීම සඳහා දායක වීම.

## ප්‍රශ්න අංක - 36

ඔබේ කාර්යයන් වලින් වාසි ලබන්නන් කව්රුන්ද? මුස්ලිම් සමාජය පමණක්ද?

*පිළිතුර* : මා ඉහත සඳහන් කළ කාර්යයන් වල සමාජ ප්‍රතිසංස්කරණය සියයට සියයක්ම මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගත් වැඩ පිළිවෙලකි. මෙය ඉස්ලාමීය ඉගැන්වීම මුල් කර ගනිමින් ඉදිරිපත් කරන සමාජ ප්‍රතිසංස්කරණයක් නිසා, ඉලක්ක කරගත හැක්කේ මුස්ලිම් ප්‍රජාව පමණි. එසේ නොමැති කොට ගැටළු ඇතිවිය හැකිය. ඉතිරි කාර්‍යයන් හතර කාටත් පොදු ඒවාය. එය සියළු දෙනාටම ප්‍රයෝජන ගෙන දෙන වැඩ පිළිවෙලක්.

## ප්‍රශ්න අංක - 37

මෙම කාර්‍යයනහි නිරත වන්නේ කව්රුන්ද? ජමාතේ ඉස්ලාමි සංවිධානයේ සාමාජිකයින් පමණක්ද? ඒවා ක්‍රියාත්මක කෙරෙන්නේ කෙසේද?

*පිළිතුර* : මා මුලින් සඳහන් කල පරිදි ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානය තමන් සමග එකතුවී වැඩ කරන අය සඳහා මගපෙන්වීම් සංකල්ප හඳුන්වා දී තිබෙනවා. කලයුතු කාර්‍යයන්ද හඳුන්වා දී තිබෙනවා.

ඔවුන් සතුව ඇති සම්පත් අනුව ඔවුන්ට වැඩකල හැකියි.

නිදසුනක් වශයෙන්

1. ජමාතේ ඉස්ලාමි සංවිධානය තමන් තුල ක්‍රියාත්මක කරන කාර්‍යයන්.

2. ජමාතේ ඉස්ලාමි සංවිධානයේ සාමාජිකයින් හා ආධාරකරුවන් එකතුව ස්වාධීනව ක්‍රියාවට නගන සාමූහික ව්‍යාපෘති.

3. ජමාතේ ඉස්ලාමි සංවිධානයේ සාමාජජිකයෙකු හෝ කිහිප දෙනෙකු එක්ව සමාජයේ ක්‍රියාත්මක කරන කිසියම් ව්‍යාපෘතියක් ඇත්නම්, එයට සම්පූර්ණයෙන් හෝ හැකිතරම් දායකත්වයක් ලබාදීමට උස්සාහ කිරීම.

මෙහි ඇති ගැටළුව ඉහත සඳහන් දෙවෙනි තෙවෙනි කාර්යයන් ජමාතේ ඉස්ලාමි සංවිධානයේ කාර්යයන් ලෙස සමාජයේ ඇතැමුන් සිතීමයි. සමහර අවස්ථාවල සංවිධානයේ සාමාජිකයින් පිරිසකුත් ඒවා අප සංවිධානයේ කාර්යයන් බව පුරසාරම් දොඩනවා. එහෙත් සත්‍යය එසේ නොවේ.

මෙවැනි කාර්‍යයන් ක්‍රියාවට නැංවීමේදී අනුගමනය කලයුතු පිළිවෙත් හඳුනා ගන්නේ නම් එහි පසුබිම අවබෝධ කරගත හැකියි.

සංවිධානයේ සාමාජිකයින් හා ආධාරකරුවන් එකතුවී ස්වාධීනව කරන කිසියම් ආයතනයක් හෝ සේවාවක් හෝ ආරම්භ කිරීමට තීරණය කිරීමේදී ඔවුන් පහත කොන්දේසි සම්පූර්ණ කළ යුතු වෙනවා.

a. පළමුව තෝරා ගත් වැඩ සටහන සංවිධානය කිරීමට, ක්‍රියාත්මක කිරීමට, වැඩිදියුණු කිරීමට සුදුසු කණ්ඩායමක් තිබීම.

b. එම ව්‍යාපෘතියට අදාල සියළු කටයුතුවල වගකීම ඔවුන්ම භාර ගැනීම.

c. එම ව්‍යාපෘතියට අවශ්‍ය මූල්‍යමය පහසුකම් ඔවුන් විසින්ම සකසා ගැනීම.

d. උදව් උපකාර, සම්පත්, දායකත්ව අප සංවිධානයෙන් පිටත ලබා ගැනීමට උත්සාහ කිරීම.

එවැනි පාර්ශවයක් ලෙස ජමාතේ ඉස්ලාමි සංවිධානයද සැලකිය හැකිය.

e. එම ව්‍යාපෘතීන් සඳහා යොදවන සම්පත්වලට ජමාතේ ඉස්ලාමි සංවිධානය වගකිව යුතු නැත යන්න ඔවුන් පිළිග ැනීම. (ජමාතේ ඉස්ලාමි සංවිධානයේ සම්පත් යනුවෙන් අදහස් කෙරෙනුයේ, ප්‍රධාන කාර්යාලය සතු සම්පත්ය. එම සම්පත් පරිහරණය කළයුතු ආකාරය ව්‍යවස්ථාවේ සඳහන්ය.)

## ප්‍රශ්න අංක - 38

සමාජයේ පහළ ස්ථරයේ ඔබේ සේවාවන් ක්‍රියාත්මක කෙරෙන්නේ කෙසේද?

*පිළිතුර :* එක් එක් ප්‍රාන්තයට භාරව ඇති කණ්ඩායම තමන් යටතේ

ඇති ශාඛා හා අධ්‍යයන මධ්‍යස්ථානවල ක්‍රියාකාරකම් භාරව කටයුතු කරති. කාන්තාවන්ද එම ක්‍රියාකාරකම්වල සෘජුවම සම්බන්ධ වෙති. තරමක් වර්ධනය වූ ඒකක ශාඛා ලෙසද, කුඩා ඒකක අධ්‍යයන කවය ලෙසද හැඳින්වේ. ශ්‍රී ලංකාව පුරාවටම එවැනි කව 72ක් පමණ ක්‍රියාත්මක වේ.

## ප්‍රශ්න අංක - 39

ඔබේ සංවිධානයේ ශිෂ්‍ය ව්‍යාපාරයක් තිබෙනවා නේද? ඒ ගැන හැඳින්වීමක් කරන්න පුළුවන්ද?

*පිළිතුර* : 1980 ට පෙර වැඩිහිටියන් ශිෂ්‍යයන් යනුවෙන් වෙන්කිරීමක් නොතිබුනි. සියළු දෙනා එකම සංවිධානයක් යටතේ ක්‍රියාත්මක වූහ. ඒ අවස්ථාවේ සිටි ඇතැම් ශිෂ්‍යයින් වෙනම ක්‍රියාත්මක වීමේ පහසුකම් සම්පාදනය කර දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කළා. මුල දී ජමාතේ ඉස්ලාමි සංවිධානය එයට අකමැති වූවත් පසුව එම ඉල්ලීමට එකඟත්වය පල කළා. ශිෂ්‍ය ව්‍යාපාරයක් ස්වාධීනව කටයුතු කළ හැකි ව්‍යවස්ථා මාලාවක් ඉදිරිපත් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියා.

සභාපති, මධ්‍යම කාරක සභාව, සාමාජිකයින් බඳවා ගැනීමේ ක්‍රම වේද, වැනි සංවිධානයකට අවශ්‍ය සියළු අංග ඇතුලත් උචිත ව්‍යවස්ථා මාලාවක් ඔවුන් විසින් ඉදිරිපත් කිරීමෙන් පසු, ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානයට අනුබද්ධ සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වීමේ අනුමැතිය එම ශිෂ්‍ය ව්‍යාපාරයට ලබා දුන්නා.

මෙම ශිෂ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානයට සමාන අරමුණු ඇති, ස්වාධීනව කටයුතු කළ හැකි සංවිධාන ව්‍යූහයක්.

ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානයේ ව්‍යවස්ථාව අනුව මෙවැනි අනුබද්ධ සංවිධානවලට උදව් උපකාර අවශ්‍ය කරන අවස්ථාවලදී ඒවා ලබා දීමටත්, උපදෙස් ලබාදීමටත් ජමාතේ ඉස්ලාමි සංවිධානය බැඳී සිටිනවා. එහෙත් එවැනි සංවිධානවල ක්‍රියාකාරකම්වලට ජමාතේ ඉස්ලාමි සංවිධානය වග කියන්නේ නැහැ.

## ප්‍රශ්න අංක - 40

තරුණයින් වන ශිෂ්‍යයින් ස්වාධීනව තැබීම නිවැරැදි ද? අත්දැකීම් අඩු ඔවුන් නොමගට යොමු විය හැකි නේද?

*පිළිතුර :* ශිෂ්‍ය සංවිධානයට යම් යම් සීමාවන් තිබෙනවා. ව්‍යවස්ථා ක්‍රියාපටිපාටියක් තිබෙනවා. ස්ථාවර කිහිපයකුත් තිබෙනවා. මොනවගේ තලවලවද වැඩ කල යුතුද යන සීමාවන් ඔවුන්ට තිබෙනවා. එම නිසා ශිෂ්‍ය ව්‍යාපාරය ව්‍යවස්ථාවට පටහැනිව මෙහෙයවන්නට පුළුවන් කමක් නැහැ. එසේ කිරීමට තැත් කලහොත් ඔවුන්ට සංවිධානයෙන් අයින්වෙන්න සිදු වෙනවා. නැත්නම් සංවිධානයෙන් පහ කරනු ලබනවා.

මෙවැනි සීමාවන් සමග නිදහසේ වැඩ කිරීමේ අවස්ථාවන්ද ඔවුන්ට ලබාදී තිබෙනවා. වැඩ කිරීමේ නිදහස ලබාදීම තුලින් තරුණයින් තම ප්‍රශ්න තමන් විසින්ම විසඳා ගැනීමේ හැකියාව වර්ධනය කර ගැනීමට රුකුලක් වෙනවා.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පටන් ඈත ගම් පලාත්වලත් තරුණයින්ගේ ගැටළු සාකච්ඡාවට ලක්වෙනවා. තරුණයින්ගේ නිර්මාණශීලී දායකත්වය ලබා ගැනීමේ පහසුකම් සලසා දිය යුතු බවත්, ඔවුන්ගේ හැකියා දක්ෂතා ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවයත් එම සාකච්ඡාවලදී අවධාරණය කෙරෙනවා. එය ලොව පිළිගත් සම්ප්‍රදායක්.

ඒනයින් වසර 40ක පමණ කාලයක් උස් පල්ලම් තරණය කරමින්, ස්වාධීනව, සංවරව ක්‍රියාත්මක වූ ශිෂ්‍ය සංවිධානයක් ලෙස ශ්‍රී ලංකා ඉස්ලාමීය ශිෂ්‍ය ව්‍යාපාරය හැඳින්වීම නිවැරදි යැයි මා සිතනවා.

## ප්‍රශ්න අංක - 41

ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට එරෙහිව වෛරී ප්‍රකාශ හා ප්‍රචණ්ඩ ක්‍රියා වර්ධනය වෙමින් පවතින අවස්ථාවක, එවැනි ගැටළුවලට මුහුණ දීමේ සැලසුමක් ඔබ සංවිධානය සතුව තිබේද?

*පිළිතුර* : මෙය ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නයක්. වෛරී ප්‍රකාශවලින් ගැටළු විසඳා ගත හැකි ද? රටේ සංවර්ධනයක් ඇති වෙයි ද? ශ්‍රී ලංකාවේ යහපත් අනාගතයක් පතන උදවිය මේ ගැන කල්පනා කල යුතුයි. ශ්‍රී ලංකාවේ අනාගතයත්, ඒ සඳහා වන සැලසුම්, ක්‍රියාමාර්ග යනාදී සංවර්ධන හමස් පෙට්ටියක වසා දමා, රටේ නායකයින් පටන් සාමාන්‍ය ජනතාව වෛරී ප්‍රකාශවල නිරත වීමෙන් රටට සෙතක් වෙයිද? වෛරී ප්‍රකාශ හා ඉන්පසු රඟ දක්වන ප්‍රචණ්ඩත්වය නිසා ක්ෂණික හානිය සුළු ජන කොටස්වලට වුනත් දීර්ඝ කාලීනව මෙයින් බැට කන්නේ අපේ රට නොවේ ද?

මෙවැනි ගැටළු අප වගේ සුළු සංවිධානයකින් විසඳන්න පුළුවන් කමක් නැහැ. සියළු දෙනා එකතුම මෙම තත්වය ගැඹුරින් අධ්‍යයනය කර තීරණයකට එළඹිය යුතුයි.

අපේ රටේ ජනතාව රජයක් පත් කරගන්නේ සමස්ථ ජනතාවගේ ආරක්ෂාව හා අයිතිවාසිකම් තහවුරු කරමින් සාමය හා සෞභාග්‍යය උදා කිරීමටයි. ඒනයින් බලන විට ඕනෑම ගැටළුවකට වගකියන්න ඕනේ රජයයි. එහෙත් එවැනි තත්වයක් අද දකින්නට නැහැ. රටේ මුස්ලිම්වරුන්ගේ හැඟීම නම්, අපි ජීවත් වෙන්නේ රජයක් නොමැති රටක යන්නයි. මෙයින් ඇඟවෙන්නේ බලය අතට ගත් බලධාරීන්ට ඕනෑම දෙයක් කළ හැකිය යන්නයි.

ජන මාධ්‍ය අමු අමුවේ ජාතිවාදය වපුරනවා. ජන මාධ්‍යකරුවන් තමන්ගේ අතැති කැමරාවෙන් අහිංසක ජනයාගේ ගෞරවය රූප ගතකර ඔවුන්ව චරිත ඝාතනයකට ලක් කරනවා. බොරු හා අවලාද පමුණුවා පුද්ගලයෙකුගේ ආත්ම ගෞරවය වනසනවාට වඩා ඔහුගේ ජීවිතය නැති කිරීම යහපත් බව දිවංගත ජනාධිපති ආර් ප්‍රේමදාස මැතිතුමා කල ප්‍රකාශය මෙහිදී මතක් වෙනවා.

## ප්‍රශ්න අංක - 42

ත්‍රස්තවාදය සමග විදෙස් සම්බන්ධතා සම්බන්ධ කරන තත්වයක් තිබෙනවා. ඔබේ සංවිධානයේ විදේශ සබඳතා තිබේද? එසේනම් කුමන ආකාරයේ විදෙස් සම්බන්ධතාවක් ඔබගේ සංවිධානය පිළිපදින්නේද?

*පිළිතුර* : ජමාතේ ඉස්ලාමී සංවිධානය මුල සිටම තම විදෙස් සම්බන්ධතා පිළිබඳ පැහැදිලි ස්ථාවරයක සිටිනවා. අද දක්වා එම ස්ථාවරයේ කිසිදු වෙනසක් සිදුවී නැහැ.

ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානය ශ්‍රී ලංකාවට ආවේණික සංවිධානයක් වශයෙන් ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න ඉහතින් අපි විස්තර කර දුන්නා.

ජමාතේ ඉස්ලාමී සංවිධානය යන නමින් හෝ වෙනත් නමකින් හෝ ලෝකයේ ඕනෑම ප්‍රදේශයක ක්‍රියාත්මක වන කිසිම සංවිධානයක් සමග නිල හෝ නිල නොවන සම්මුතියක් අපට නැහැ. මින් මතුවටත් එය එසේමයි යන්න අපගේ ස්ථාවරයයි.

මේ හැර ලෝක මුස්ලිම් සංවිධානවල හෝ රජයෙන් අනුමත සිවිල් සංවිධාන හෝ පවත්වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට සහභාගිවන ලෙස අප සංවිධානයට ආරාධනා ලැබෙන අවස්ථාවන් තිබෙනවා. එවැනි සම්මන්ත්‍රණවල ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානයේ නියෝජිතයින් සහභාගි වී තිබෙනවා. එවැනි සබඳතා බොහෝදුරට එම සම්මන්ත්‍රණය හා සීමා වෙනවා.

## ප්‍රශ්න අංක - 43

ඔබේ වැඩ සටහන්වලදී ඔබ සමග සහයෝගයෙන් වැඩ කිරීමට හෝ සෘජු ප්‍රචාරක කටයුතුවලට හෝ නිරතවීමට විදෙස් ප්‍රචාරකයින් පැමිණෙන ක්‍රමයක් තිබේ ද?

*පිළිතුර* : වසර 65ක් තිස්සේ ජමාතේ ඉස්ලාමී සංවිධානය මේ

රටේ ක්‍රියාත්මක වෙනවා. මෙම දීර්ඝ කාලය තුල අප සංවිධානයට විදෙස්වලින් කිහිප දෙනෙක් පැමිණ තිබෙනවා. එහි උපරිම සංඛ්‍යාව දහයටත් අඩුය.

මෙය හැර ජමාතේ ඉස්ලාමී සංවිධානයේ වාර්ෂික සමුළුවලට ආරාධි අමුත්තන් වශයෙන් සහභාගිවීමට කිහිප දෙනෙක්ම පැමිණ තිබෙනවා. සම්ප්‍රදායි ආරාධිත අමුත්තන් වශයෙන් ඔවුන් විනාඩි 15ක හෝ 20ක කෙටි දේශණයක් එහිදී ඔවුන් පවත්වනවා.

## ප්‍රශ්න අංක - 44

ජමාතේ ඉස්ලාමී සංවිධානයේ සුවිශේෂී අංග යනුවෙන් හඳුනා ගත හැකි මොන හෝ සුවිශේෂි කරුණු තිබෙනවා ද?

*පිළිතුර* : මා මෙතෙක් ඉදිරිපත් කළ සෑම කරුණක්ම ඇතැම් උදවියගේ ආකර්ෂණයට හේතුවක් වන්නට පුළුවන්. එහෙත් නොකරන කාර්‍යයන් දෙකක් ගැන සඳහන් කිරීම වැදගත් යැයි සිතනවා.

(ආ) ජමාතේ ඉස්ලාමී සංවිධානය තම චින්තනය හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා තමන්ටම කියා පල්ලියක් හදා වෙන්කර ගෙන නැහැ. ගමේ තිබෙන මුස්ලිම් පල්ලියේ අනුමැතිය ලබාගෙන අපගේ වැඩසටහන් එහි දියත් කරනවා. එය ප්‍රතික්ෂේප වූවහොත් එම පල්ලිය හා ඝට්ටනයකට හෝ එම පල්ලියේ පරිපාලකයින් සමග උරණවීමට හෝ ජමාතේ ඉස්ලාමී සංවිධානය කිසිවිටකත් උත්සහ කරලා නැහැ. එයට වෙනස්ව ගමේ සුහසාධන වැඩකටයුතුවලට සහභාගි වී සාමකාමී පරිසරයක්

නිර්මාණය කිරීම අප සංවිධානයේ අභිලාෂයක්. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුලින් අනුමත නොකල මුස්ලිම් පල්ලි බොහෝමයක් පසුව අපිව ආරාධන කරන තරමට තත්වයට වෙනස් වුනා. වැරදි මත තිබූ ස්ථාන අවබෝධයෙන් වැඩ කරන ස්ථාන බවටත් පරිවර්තනය වුනා.

මහජනතාවගේ සුභසාධනය වෙනුවෙන් පිරිසිදු චේතනාවකින් යුක්තව කටයුතු කිරීමත්, කැපීපෙනීමට උත්සාහ නොකිරීමත්, අන් අය සමග එකතුවී වැඩ කිරීමේ ප්‍රතිපත්තියටත් ලැබූ ජයග්‍රහනයක් ලෙසත් අපි මෙය දකිනවා.

(ආ) දෙවෙනි කාරණය සෘජු දේශපාලනයට සම්බන්ධ වීමට හෝ එහි නිරතවීමේ තීරණයකට හෝ ජමාතේ ඉස්ලාමී සංවිධානය මෙතෙක් එලඹී නැහැ. මෙරටේ බොහෝ කටයුතු ජනවර්ග පදනම් කරගෙන ක්‍රියාත්මක වන පරිසරයක් උදාවී තිබෙනවා. සිංහල දේශපාලනය, දෙමළ දේශපාලනය, මුස්ලිම් දේශපාලනය වශයෙන් බෙදී වෙන්වී ඇති අතර, සිංහල පාසල්, දෙමළ පාසල්, මුස්ලිම් පාසල් වශයෙන් අධ්‍යාපනයද බෙදා වෙන්කර තිබෙනවා.

ඉස්ලාමීය ඉගැන්වීම් මුල් කරගෙන ක්‍රියා කරන සංවිධානයක් ලෙස "මෙම විෂම පරිසරය වෙනස් කළ යුතුය. අවම වශයෙන් එයට සහාය හෝ නොදැක්විය යුතුය" යන ප්‍රතිපත්තිය අනුගමනය කරනවා. මේ ස්ථාවරය හේතුවෙන් අපි මෙම කූට පක්ෂ දේශපාලනයෙන් මිදී ඈත්වී සිටිනවා.

එහෙත් රටේ යහපත උදෙසා දේශපාලනය කරන සියලු දෙනා සමග පක්ෂ භේද නොබලා සහයෝගයෙන් කටයුතු කිරීම යන තීරණය අප සංවිධාන සතුව පවතිනවා. එම තීරණය අදටත් ක්‍රියාත්මකයි.

මේ කරුණු දෙක විශේෂයෙන් සඳහන් කිරීමට හේතුව පළමු තීරණය ප්‍රජා යහපත හා දෙවෙනි තීරණය රටේ යහපත පදනම් කරගෙන තිබීමයි. අප සංවිධානය මෙම තීරණයට එකඟව දීර්ඝ කාලයක් කටයුතු කලද, අපේක්ෂිත වර්ධනය අත්පත් කර ගැනීමට අපොහොසත් වී ඇති බවට සංවිධානයේ ඇතැම් සාමාජිකයින් චෝදනා නගනවා.

ජමාතේ ඉස්ලාමී සංවිධානයේ වර්ධනය පමණක් ප්‍රතිපත්තියක් කර ගනිමින්, රට ජාතියට හානියක් සිදුවීමට නම් අපි කිසිසේත්ම එකඟ වෙන්නේ නැහැ.

යහපත් දේශයක්, යහපත් සමාජයක් සඳහා සිහින දකින ජමාතේ ඉස්ලාමි සංවිධානය, ඉහත සඳහන් ප්‍රතිපත්ති වලට එරෙහිව ක්‍රියා කළ හැකිද?

සමාප්තයි

**ප්‍රකාශනය ඃ**


ශ්‍රී ලංකා ජමාඅතේ ඉස්ලාමි
77, ශ්‍රී වජිර ඥාන මාවත, කොළඹ - 09
දුරකථන ඃ 0112687091
ෆැක්ස් ඃ 0112686030
E-Mail secretariatsslji@gmail.com